

# مهمة الإنسان في هذا الوجود

# ඉස්ලාමීහී මිනිසාගෙ වැදගත්කම

باللغة السنهالية

# ඉස්ලාමීගී
# මිනිසාගේ වැදගත්කම

කතෘ

යූසුෆ් අල් කර්ළාවි

සිංහලෙන්

අබ්දුල් හකීම් මුහියිද්දීන්

නිරීක්ෂණය

මුහම්මදු නාසිම්

ⓒ دار الورقات العلمية للنشر والتوزيع ، ١٤٢٥هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

القسم العلمي بالدار

مهمة الإنسان في هذا الوجود. / القسم العلمي بالدار؛ عبدالكريم محى الدين.- الرياض، ١٤٢٥هـ

٥٢ ص؛ ١٢ × ١٧ سم

ردمك: ٥ - ٣ - ٩٥٤٩ - ٩٩٦٠

(النص باللغة السنهاليه)

١- التوحيد ٢- العبادات (فقه اسلامي) أ. محى الدين، عبدالكريم (مترجم) ب. العنوان

ديوي ٢٤٠ ١٤٢٥/٣٢٧٢

رقم الإيداع: ١٤٢٥/٣٢٧٢

ردمك: ٥ - ٣ - ٩٥٤٩ - ٩٩٦٠

**حقوق الطبع محفوظة**

**الطبعة الأولى**

**١٤٢٥هـ - ٢٠٠٤م**

بسم الله الرحمن الرحيم

මහා කාරුණික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙන්, පැසසුම් සියල්ල සර්වඥාන අල්ලාහ්ට අයත්වේ. ඔහු ප්‍රශංසා කර ඔහුගෙන්ම සහාය පතා සිටිමු. අපගේ පාපයන් හට ඔහුගෙන්ම පව්සමා අයදිමු. පව් සහ නින්දිත ක්‍රියාවන් හට ලක් නොවී සිටීමටද ඔහුගෙන්ම සහාය පතමු. කරුණාබර අල්ලාහ් පෙන්වන යහමග කවරෙකුට ලැබෙන්නේද, ඔහුනොම නොමග යැවීමට කිසිවෙකුට කළ නොහැකිය. එමෙන්ම අල්ලාහ්ගේ යහමග කවරෙකුට නොලැබෙන්නේද, ඒ තැනැත්තා යහමගට කිරීමට කිසිවෙකුට කළ නොහැකිය. නමද වැඳීමට සුදුසු එකම දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැති බවත්, වක්තෘ මුහම්මද් තුමා අල්ලාහ්ගේ කීකරු අත වැසියා සහ අවසාන වක්තෘවරයා බවත් මම සාක්ෂි දරමි.

මෙම අති විශාල විශ්මිත ලෞකිකය නිර්මාණය කළ සර්වබල සර්වඥාන අල්ලාහ් දෙවිඳු එයින් නොනැවතී කාබී සිත පිනවන විලසින් සතුටෙන් ආශාවන් සන්තර්පනය කර ප්‍රීති ප්‍රමෝදව ජීවත් විය හැකි පාරම්පරිකව උරුමක්කාරයින් සමගින් වූ මාද සම්භාවණීය ලෙස එහි නිර්මාණය කළේය. ඒ නිර්මාතෘ වරයා මා නිර්මාණය කළේ කුමන හේතුවක් උදෙසාද? කුමක් පිණිසද? මහපොළොවේ යහමින් ජීවත්විය හැකි අසුරු අලංකෘත වූ සියලු භාග්‍යයන් මා සතු කර දුන් ඒ සර්වබල දෙවිඳු මා වෙතින් බලාපොරොත්තු වන්නේ කුමක්ද? මිහිපිට ජීවත්වන කාලය තුල මා ඔහුට කළ යුතු යුතුකම් සහ ප්‍රතික්‍රියා කුමක්ද? භුදෙක් මා මෙලොව භුක්ති විඳිමින් ජීවත්වන ජීවිතයේ පරිසමාප්ත හරය සහ ඉලක්කය කුමක්ද? මිනිස් මොලය පදුරුගාන එවැනි දහසකුත් එකක් පැනවලට මොලොව උපත ලද මියදෙමින් සිටින

සියලු දනන් තම ඥානය හසුරුවා පිලිවදන් සෙවිය යුතු අති මුඛ්‍ය සන්ධිස්ථානයකට පත්ව සිටී.

මිහිපිට සම්පත් භුක්ති විඳිමින් පරමාදර්ශීව එහි ජීවත් වීමට වරම ලද මිනිසා තමා ජීවත්වන අල්ප ජීවිත කාලය තුල තමා නොදැනුවත්ව කරන වැරදි සහ අනෙකුත් අසාමාන්‍ය ක්‍රියාවන් සහ අදැමිටු ක්‍රියාවන් විශාල ප්‍රති ක්‍රියාවන් සහ විපරීතයන් ඇති කළ හැකි එකක් වුවද සමහර විට දයාන්විත අල්ලාහ් දෙවිඳු ඔහු කෙරෙහි වූ මහත් දයාව කරුණාව අරභයා ඒවා සියල්ල උදාර අන්දමින් සසමා වී ස්වර්ගය පිවිසීමට අවස්ථාව උදා කරන්නේය. නමුදු මිනිසා තමා මොලොව උපත ලද හේතුව සහ ඉලක්කය නොදැන, ඔහු ක්‍රියා කළ යුතු ආකාරය ගැන මනා දැනුමක් අවබෝධ යක් නැතිව, මා මවන ලද්දේ කා විසින්ද? මා නිර්මාණය කර සැක සුරුවම් කළ මගේ නිර්මාපකයා මගෙන් බලාපො රොත්තු වන්නේ කුමක්ද, කවදා හෝ මරණය තුරුළු කර ගත යුතු මා මරණයෙන් පසු සේන්දු විය යුතු අවසන් සන්ධි ස්ථානය කුමක්ද? එහි මා ලබා ගන්නා සුවහෝ දුක හෝ කුමක්ද වැනි අනේකවිධ කරුණු ගැන මනා දැනීමකින් තොරව, ඒ ගැන දැනුමක් ලබා ගැනීමට උත්සාහ නොකරද සැකයටත් අවිඥානයටත් ධ්‍රැවගතවී පසුවීම ඒ නිර්මාපකයා වන සර්වබල අල්ලාහ් දෙවිඳු කිසිදාක සමා නොවන බව අප සියලු දෙනා තරයේ වටහා ගත යුතු ප්‍රධාන කරුණකි.

මිහිපිට තුල ඇති අසංඛ්‍යාත විශ්මිත නිර්මාණයන් සර්වඥාන අල්ලාහ් දෙවිඳු විසින් සූක්ෂම අන්දමින් නිර්මාණය කර ඇත. ඥානාන්විත අල්ලාහ් දෙවිඳු විසින් නිර්මාණය කරන ලද ඒ නිර්මාණයන්ගෙන් නිර්මාණයක් වන මිනිසා අති සම්භාව ණයට පත් කරනු වස් තම අන් කිසිදු නිර්මාණයකට ප්‍රධානය නොකළ දයාදයක් වන ඥානය ලබා දී අති සම්භාවණයට පත්

කළේය. මිනිසා උසස්බවට පත් කර ඇති ඥානය හසුරුවා යමක් කරනවිට එය කළ යුතුද නොවන්නට නොයුතුද යන ස්ථිර තීරණයකින් වටහා ගෙන බුද්ධිගෝචරව කටයුතු කළ යුතුව ඇති බව අසහාය අනපනත්ද මවදන්ද ලබන්නේය.

එසේ ස්ථිරසාර අසහාය නීති ගොන්නක් දයාද කර ගනිමින් මිහිපිට පත්වූ මිනිසා තමාට පවරා ඇති යුතුකම් සපුරාම අමතක කර නොවන්නට අවස්ථා එළඹූ කළ ඒවා ඉටු කිරීමෙන් උදාසීන වී තමා ගැනද තම නිර්මාතෘවරයා ගැනද අමතක වී හදමනසට වහල් වී අත්තනෝමතික අන්දමින් කටයුතු කරන්නේය. කවදා හෝ ඇති විය හැකි තම මරණයෙන් පසු තමා ඒකාන්තයෙන්ම සේන්දු විය යුතු ස්ථානය ගැන අමතක කර ඒ අරමුණ උල්ලංඝනය කරමින් හෝ ඒ ගැන දැනුමකින් තොරව හෝ නිෂ්ඵලව සිත්සේ කටයුතු කරන්නේය. එසේ තමා මත ගොඩ ගැසී ඇති අනන්ත අප්‍රමාණ යුතුකම සහ වගකීම් ගැන නොසළකා එළුබැටළු වැනි සත්ත්වයන් සේ කාබී උවමනා වූ විට තමන් හට ආවේණික ආශාවන් සන්තර්පනය කර ගනිමින්ද, මා ලබාගත් මිහිපිට ජීවිතය මෙය වේ, නිරන්තර නිසංසල මා බලාපොරොත්තු වන ජීවිතයද මෙය වන්නේය මෙය හැර අන් ජීවිතයක් මිහිපිට නැත යනුවෙන් සිතා සාර්ථක සසර ජීවිතය යන රාමුවෙන් එපිට පැන තම ජීවිතය නිමක් නැති මහා විනාශ මුඛයක් කරා යොමු කරමින් පසුවීම අති නිහීන සහ සංවේගනීය සිද්ධියකි.

මිනිසා අගනා ඥානයක් තමා සතු කරගත් සත්ත්වයක් වලසින් කම්සැප ජීවිතයේ අගිසිවල හැපෙමින් ජීවත්වී තම වටිනා කාලය සහ හෝරාව අනිවාර්යෙන් ගෙවා දමමින් පසු වන විට ඔහු නොදැනුවත්වම අල්ලාහ් දෙවිඳු විසින් නියම වූ ඔහුගේ යථාර්ථ එනම් මරණය ඔහු අත්පත් කර ගැනීමට

අපේක්ෂා රහිතව ඔහු වෙත ළඟා වන්නේය. තමා අසහාය ඥානයක් ලැබුවද මරණය ළඟාවන ඒ අවසන් මොහොතේදී එයට මුහුණ දීමට නොහැකිව බියට පත්ව උදාසීනයෙන් නොසැළකිල්ලෙන් ගෙවා දැමූ අවස්ථා ගැන මෙනෙහි කරන්නේය. තමා මෙතෙක් කල් මිහිපිට අතිචාර්ථ කාලය ගෙවා දැමූ හෙයින් මිහිපිට වසන්නට සුළු මොහොතක් ඉල්ලා තමා නිවැරදි කරගැනීමට හෝ කල් නොදෙන ඒ සුවාස මොහොත ගැන සංවේගයට පත්ව ජීවත්වීමට කිසි සේත් නැවත අවස්ථාවක් නොලැබෙන ඒ මොහොතේ, දුදනෙන් මිදී සාර ධර්මයෙන් සසර වසන්නට තවත් අවස්ථාවක් ලබා ගැනීමේ මහත් ආශාවෙන් තම හිමිගෙන් යටහත් පහත්ව අයැද සිටින්නේය.

ඒ අවසන් මොහොත සෑම මිනිසා වෙතම ළඟාවන්නට පෙර හෙතෙම තමාගේ නිර්මාතෘ වරයා කවරෙක්ද? තමා මිහිපිට නිර්මාණය වූ හේතුව කුමක්ද? මිනිස් නිර්මාණයේ අවසන් ඉලක්කය කුමක්ද? මිහිපිට තමා විසින් ඉටු කළ යුතු වැදගත් යුතුකම් සහ දැමිටු ක්‍රියා සම්භාරය කුමක්ද තම නිර්මාණයේ ඉලක්කය සහ එහි ප්‍රතිවිපාකය කුමක්ද ඒ විපාකයේ තත්ත්වය කුමක්ද වැනි සුවහසක් ප්‍රශ්නවලට පිළිවදන් සෙවිය යුතු මහගු අවස්ථාවකට ඔහු පත්වී සිටින් නේය. ඒ පැනවලට පැහැදිලි පිළිවදන් සොයා ගෙන ඒ අර්ථාන්විත මහගු උපදෙස් තුලින් කෙළවරක් නැති මර ණෙන් මතු සදාතනික ජීවිතය පහන් කර ගැනීමට තම සසර ජීවිතය සකස් කර ගත යුතුය.

මිනිසා තමාගෙන්ම විමසා ගත යුතු පැනය

කැළඹුණු සිතින් ඔකඳ වී සසර වසන සෑම මිනිසාම තමා වෙතින්ම විමසා ගත යුතු ප්‍රශ්ණ රාශියක් ඔහු ඉදිරිපිට ගොඩ ගැසී ඇත. ඒ පැන අසා ඒවාට පිළිවදන් සොයා පැහැදීමට

පෙර පිළිවදන් සොයා ගතයුතු තවත් පැන කීපයක්ද මිනිසා ඉදිරියෙහි හොල්මන් කරමින් පවතී. ඒවා :

1. මා කවරෙක්ද? මා පැමිණියේ කොහි සිටද? එනම් මා නිර්මාණය කරන ලද්දේ කා විසින්ද?

2. මිහිපිට මා නිර්මාණය වූයේ කුමන හේතුවක් උදෙසාද? මාගේ නිර්මාතෘ වරයා මාගෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද? නොදැනුවත්ම මෙලොව එළිය දුටු මා කවදා හෝ මගේ දැනුමෙන් තොරවම මෙලොවෙන් ඉවත් වී මිය යන්නේය. එසේ මා මිය ගියා නම් මරණෙන් පසු මා සේන්දු වන ස්ථානය කුමක්ද?

පෙර සඳහන් කළ පැන දෙක මාධ්‍ය වේදීන්ගේ, දාර්ශනි කයන්ගේ දෘශ්ටි කෝණයෙන් පවසන විට 'මා පැමිණියේ කොහි සිටද, කුමන හේතුවක් උදෙසා පැමිණියාද, මගේ මර ණෙන් පසු මා යා යුත්තේ කිනම් ස්ථානයකටද' යනුවෙන් අර්ථ කථනය කළ හැකිය. අති බෙලහීන අවධියක උපන් මිනිසා තම කුඩා අවධිය පසු කර පරිණත වී සිය නැන නුවණ හොබවා ඥානය මුල් කරගෙන සිතා දැනුම ලබා කටයුතු කිරීමට වෙර දරණ කළ අප පෙර නැගූ පැනයම ඔහුගේ හදමනස තුල විශාල ප්‍රවාහයක් ඇති කරන්නේය. ඒ කුකුස ඔහුගේ චින්තන පද්ධතිය පහුරු ගාන්නේය. තවද ඔහු ඒ පැනවලට ස්ථිරසාර නිවරැදි විසඳුම ලබා ගන්නා තුරු හෙතෙම ඒ වෙනුවෙන් සිතමින් සුභවාදීව කටයුතු කිරීමට උත්සුක වන්නේය.

ඒ මුඛ්‍ය පැනවලට ස්ථිරසාර පැහැසැර පිළිවදන් නොල බන්නට තම ස්ථාවරය හෝ ඔහු විසින් කළ යුතු යුතුකම් කුමක්ද යන්න හෝ නොවන්නට මිහිපිට ඔහුගේ කාර්ය භාර්යය කුමක්ද යන්න හෝ පහසුවෙන් දැන ගන්නට නොහැකිව මංමුලාවීම නොවළක්විය හැකිය. තවද හෙතෙම,

තමා කවරෙක් ද? තමා කුමන අරමුණක් උදෙසා මිහිපිට නිර්මාණය වීද? කිසිවක් නැතිව තිබුණු තමා කොහි සිට පැමිණියාද? තමාගේ මරණෙන් පසු තමා යා යුතු ස්ථානය කුමක්ද වැනි සුවහසක් තොරතුරු ගැන නොදැන සිටින්නේ නම් හෙතෙම මිහිපිට තම ස්ථාවරය ඉලක්කය ගැන ස්ථිරසාර අවබෝධයක් ලබා ගන්නේ කෙසේද?

එත්මන් මිනිසා ඒ පැනවලට පිළිවදන් සොයනු වස් ලොවේ අට්දිග් බාගයේ පසුවන විද්වතුන්, ඇදුරන්, ප්‍රඥයන් අති මහත් පරිශ්‍රමයක යෙදී සිටිති. ඒ වෙනුවෙන් කරන සමීක්ෂණ බොහෝය. ඒ විද්වතුන්ගේ දර්ශන, සොයා ගැනීම් සහ අදහස්උදහස් කියුම් නිවැරැදි හෝ වැරැදි හෝ වන්නට එයට සුදුසු පිළිවදන ඔවුන් විසින්ම තෝරා බේරා ලබා ගත යුතුය යන්නද අප මෙහිදී වටහා ගත යුතුව ඇත.

කොහි සිටද කුමටද කොහිද?

ජීවිතයක් ලබා සැරිසරන මිනිසා වන මා නිර්මාණය කරන ලද්දේ කා විසින්ද? ඒ නිර්මාතෘ වරයා කුමකින් කෙසේ මා නිර්මාණය කළාද? කිසිදු පෙර දැනුම් දීමකින් තොරව විශ්මිත ලෙස මහපොළොවට මා කැඳවා ගෙන එන ලැබුයේ කා විසින්ද? මා අවට මගේ දර්ශනයට අසුවන ඉමක් කොණක් නැතිව පැතිරී ඇති මහපොළොව සහ එහි ඇති ලස්සන අවලස්සන කුදුමහත් නිර්මාණයන් නිර්මාණය කරන ලද්දේ කා විසින්ද? මෙලොව මා නිර්මාණය වූ හේතුව කුමක්ද?මේ මිහිපිට අගනා ජීවිතයක් ලැබූ මා සසර වසා සියල්ල අත් හැර මරණයට පත් වූ විට යා යුතු ස්ථානය කුමක්ද? උපතක් ඇති කළ විපතක් එනම් මරණයක් ඇති සේ මේ ලොවටත් අවසානයක්, විනාශයක් වේද? එසේ අවසානයක් වේ නම් ඒ අවසානය හා කුමක් සිදුවියද? එය කෙසේද? එසේ අවසානයක් වේ නම් මා මිහිපිට ජීවත්වන තාක් කල්

ඒ උදෙසා පිළිපැදිය යුතු ඍජු පිළිවෙතක් වේද? එසේ නම් ඒවා කුමක්ද? ඒවා කිනම් ආකාරයක එකක්ද? ඒවා කා විසින් දෙන ලද්දක්ද? එහි නීතීන් මා විසින් සංස්ථාපනය කර ලද්දක්ද? ඒ නීති පද්ධතීන් පිළිවෙත් රැකීමට මා කට යුතු කළ යුතු පිළිවෙල සහ ක්‍රම කුමක්ද වැනි අපරිමිත ප්‍රශ්ණ වැලක් මිනිසාගේ ඥානය පද්ධතිය සහ මොළය නිරතුරුව පහුරු ගා පුබුදු කළ යුතුව ඇත.

එහෙයින් ඒ ගැන දැනුමක් ලබා ගනු වස් මතු නගන ලද අති වැදගත් 'මිනිසා කොහි සිට පැමිණියාද? කුමක් නිසා පැමිණියාද? ආපසු යා යුත්තේ කොයිබටද?' යන ප්‍රශ්න තුන පැහැදිලිව හදාරා වටහා ගැනීම අති වැදගත්ය.

කොහි සිට පැමිණියාද?

දෘෂ්ටියට හසුවන දේ ගැන මුළුමනින්ම විශ්වාස කරන භෞතික වාදීන්ගේ අදහස් සහ මතය අනුව මෙම වැදගත් පැණයට පිළිවදන් දෙන විට එය කිසිදු ස්ථිර පදනම් රහිත විග්‍රහයක් ලෙස කිව හැකිය. නමුදු ඔවුන්ගේ අදහස්උදහස් සහ චින්තනවල ස්වභාවය ගැන සළකා බලද්දී ඔවුන් අව්‍යාජයේ යථාර්ථයේ උගුරු දණ්ඩ මිරිකීමට තරම් වූ ස්ව මතයක එල්බ සිටී යනුවෙන් කිව හැකිය. ඔවුන් ස්වභාවය හෝ සහජත්වය යනුවෙන් පවසන කරුණුවල යථාර්ථය හරිහැටි පැහැදිලි නොවන අයුරු නම තර්කයෙන් සහ වාග් හරඹෙන් එහි ජීවනාඩිය තද කර පහසුවෙන් වටහා ගන්නට අවස්ථා නොදී එය විනාශ කරන්නට වෙර දරති. ඔවුන්ගේ අදහස සහ චින්තනය අනුව විශ්වය, එහි ජීවත් වන අය සහ එහි ඇති සියල්ල ඉබේ නිර්මාණය විය, ඇති විය යනුවෙන් වූ ඒක පාර්ශික මනඃකල්පිත ව්‍යාජ මතයක එල්බ සිටී. තවද මේ මහපොළොවේ ක්‍රියාකාරීත්වය ක්‍රමිකව සූක්ෂමව ක්‍රියාවීමට මූලික වන්නේ භූදෙක් ස්වභාවය යනු

වෙත් තම මනදොළව හඟවන අදහස් ඉදිරිපත් කරමින් කුතර්කව කටමැත දොඩමින්ද පසු වෙති. ඒ මතය කෙතෙක් දුරට ස්ථීරද යන්න ඔප්පු කිරීමට තරම් සාධක හෝ හේතු පාදක හෝ සොයා ගැනීමට ඒ ඇඳුරන් විද්වතුන් අද වන තුරු දරනා උත්සාහය කියා නිම කළ නොහැකිය.

ඔවුන්ගේ අදහසට හාත්පසින්ම විරුද්ධව යථාර්ථ මතයක් දරමින් සියලු දේ නිර්මාණය කරන ලදී යනුවෙන් විශ්වාස කරන්නන් විශ්වය සහ ඒවා තුල ඇති සියලු දේ නිර්මාණය කර පාලනය කරන්නාවූ අති සම්භාවණීය භවතෙකු අති බව ස්ථීරසාරව පිළි ගනිති. දුක්කරදර, බිය, සාංකා, උවමනාව සහ සන්තුෂ්ටිය වැනි අවස්ථාවන්හී ආරක්ෂාව සහ පිටිවහල වෙනුවෙන් තම සිත ඒ උසස් භවතා වෙත මුළුමනින්ම හැර විය යුතු බවද විශ්වාස කරයි. මෙවන් ස්ථීරසාර විශ්වාසය ඔවුන්ගේ සිතේ යටිතලයෙහිම රැඳුණු අදහසක් බවට පත්වී ඇතග ඒ ස්ථීරසාර ව්‍යවහාරික අදහස සහ විශ්වාසය මිනිසාගේ යථාර්ථ දහම ඔහුගේ ගැලවීමේ මග බව සුරවදන වන අල්කුර්ආනය පැහැදිළි කරයි. ඒ කරුණ පැහැදැලි කරමින් අල්ලාහ් දෙව්දූ අල්කුර්ආනය තුලින් මෙසේ විස්තර කරයි. *'එහෙයින් යථාර්ථ ඍජු සන්මාර්ගයෙහි සම්පූර්ණයෙන්ම ඔබගේ මුහුණ හරවා පිහිටවව. කුමන දහමෙහි අල්ලාහ් මිනිසා නිර්මාණය කළාදෝ එය ඔහුගේ (ස්ථීර) සහජ දහම වේ. අල්ලාහ්ගේ නිර්මාණයෙහි කිසිදු වෙනස් වීමක් නැත. එය ඍජුවූ සන්මාර්ගය වේග එහෙත් මිනිසුන්ගෙන් බොහෝ දෙනෙකු එය නොදන්නෝය'.* (30 : 30)

මෙම ස්ථීර සත්‍ය දිවි සංකල්පය අද බොහෝ දෙනෙකුගේ ක්‍රියා පරිපාටිය දෘඪ ග්‍රහණයකින් තොරව මන්ද අන්දමින් ක්‍රියා වේ. තවත් සමහරු තමා මිලමුදලින්, සතුටෙන් සහ නිදහසෙන් කල් ගත කරන අවස්ථාවන්හි ඒ යථාර්ථය

ස්ථාවරය ගැන අමතක කර මුළුමනින්ම පිවුදැක තම සිත් සේ කටයුතු කරයි. නොඑසේනම් ඒ සංකල්පය ගැන උදාසීන යෙන් පසුවෙයි. මිනිසාට තද දුකක්, සාංකාවක්, කරදරයක් ඇති වී ඒවාට එඩිතරව මුහුණ දෙන්නට අපොහොසත් වී හැඟීම් සහ චින්තන බෙලහීනයට පත් වන කළ හෝ ඒ වෙනුවෙන් අවට්න් සහ සමාජයෙන් පිටිවහලක් මවදනක් ලබන්නට අපොහොසත් වන කළ ඒ යථාර්ථය විශ්වය සහ එහි ඇති දේ නිර්මාණය කළ නිර්මාතෘ වරයා වෙත හැරී ඔහු වෙතින් පිටිවහල් පැතීමට උත්සුක වන්නේය. මුළුමනින්ම තම ඔනෑඑපාකම් පිණිස පිටිවහල් ලබන්නට ඒ පිටිවහලා හැර වෙනත් මගක් නැති බව කල්පනා කරන්නේය. ඔහු හැර තම උවමනාව සපුරා ගන්න හෝ දුක්කරදර ඉවත් කර ගන්න හෝ තම මනදොල සන්තර්පනය කර ගන්නට හෝ ගරා වඅටුනු සිත් සන්තාපයෙන් ඔහු වෙත හැරෙන්නේය. සෘජුව ඔහු ඉදිරියෙහි වැඳ වැටෙන්නේය.

වරෙක කෙනෙකු කීර්තිධර ඉමාම් ජඃෆර් බින් සාදික් තුමා වෙත පැමිණ තම සැකයක් ගැන විමසන් නට විය. එයට පිළිවදන් ලෙස එතුමා 'ඔබ කවදා හෝ මුහුදු ගමන් ගොස් තිබෙනවාද? යි ආගන්තුකයාගෙන් විමසූහ. එයට ඔහු 'ඔව්' යනුවෙන් පිළිතුරු දුන්නේය. 'එසේ ඔබ කළ මුහුදු ගමණකදී කවදා හෝ සුළිසුළඟක් හටගෙන ඔබ සහ ඔබගේ නැවට අනතුරු ඇතිවන අයුරු අවාසනාවන්ත අවස් ථාවකට පත්වූ වාද?' යි නැවතත් එතුමා ඔහුගෙන් විමසූහ. එයට ඔහු 'ඔව්' යනුවෙන් පිළිවදන් දුන්නේය. 'එසේ නම් ඒ අවස්ථාවේ නැවේ කපිතාන් සහ පිරිසට ඒ අනතුරෙන් ඔබ ආරක්ෂා කර ගැනීමට නොහැකිය යන අදහසක් ඔබ තුල ඇති වූනාද?' යි නැවතත් ඔහුගෙන් විමසන්නට වූහ. ඔහු 'ඔව්' යනුවෙන් පිළිතුරු දුන්නේය. 'එසේනම් ඒ අනතුරෙන් ඔබ ආරක්ෂා

කිරීමට සුදුසු ශක්ති වන්තයෙක් සිටින බව ඔබ හදමනසට හැඟීගියේද?'යි ජඃෆර් තුමා නැවත විමසූහ. එයට ඔහු 'ඔව්' යනුවෙන් පිළිතුරු දුන්නේය. 'ඔබ උදව් ඉල්ලා ඇමතුවේ කවරෙක්ද ඔහු ඔබගේ ආරක්ෂකයා වන අල්ලාහ් බව වටහා ගනිව්' යනුවෙන් අවසාන වශයෙන් එතුමා පැවසූහ. මෙනයින් බලන කළ කරදරකට පත්වූ විට උදව් වන්නේ විශ්වයේ ඇති සියල්ලට වඩා ශක්තිමත්, විශ්වාස අන්දමින් අල්ලාහ් දෙවිඳු සුද්ධවූ අල්කුර්ආනයේ කීප තැනක පැහැදිලි කරයි. '*මිනිසාට යම් විපතක් ඇති වූ කල ඔහු පසු තැවිල් ලෙන් හැරී ඔහුගේ දෙවිඳු අමතා (ප්‍රාර්ථනා කර) න්නේය*'. (39 : 8) '*(නැවේ යාත්‍රා කරන) ඔවුන් රළ වියන් මෙන් වසා ගත් විට අල්ලාහ්ට - ඔහු කෙරෙහි විශ්වාසය අවංකව තබා උදව් පතා අමතන්නේය*'. (31 : 32) 'තවද ඔබට මුහුදෙහි දුර්භිසෂයක් වූ කල්හී (අල්ලාහ්) ඔහු හැර (දෙවියන් යැයි) ඔබ අමතන සියල්ල නැති වී යන්නේය'. (17 : 67)

කීර්තිධර බටහිර ධාර්ශනිකයෙකු වන ඩිකාර්ඩ තම මතයක් ගැන පවසන කළ 'මම අඩු ලුහුඩුකමෙන් පිරුණු මිනිසෙකු ලෙස වෙමි. මා මෙසේ වෙද්දී මටත් වඩා සියලු අංශයේම පරිසමාප්තවූ ශක්තිමත් වූ කෙනෙකු මට ඉහළින් වැජඹෙන බවද මම ඉතසිතින් විශ්වාස කරමි. එසේ මා විශ්වාස කිරීමට මූලිකව මා පෙළඹෙන ලද්දේ මගේ සිත වේ. මන්දයත් මා මගේ අඩුලුහුඩුකම් සහ බැරිකම් ගැන ගනණය කරන මොහොතක් මොහොතක් පාසාම කිසිදු අඩු ලුහුඩුකමෙන් බැරිකමෙන් තොර ශක්තිමත් කෙනෙකු සිටින බව මගේ හද මටම මොරගා කියන්නට විය. ඒ ස්ථිරසාර අදහස කිසිදු උවමනාවක් නැති අඩුලුහුඩු කමෙන් බැරිකමෙන් තොර වූ ශක්ති වන්තයා සර්ව බල අල්ලාහ් දෙවිඳු බව මගේ හදමනසේ පත්ලටම හාගවන්නට විය.

මිනිසාගේ තුල සහජයෙන්ම ඇති වන්නාවූ යථාර්ථ හැඟීම් තුලින් පැන නගින අදහස් ගැන සන්සන්දනය කර බලද්දී ඒ අනන්ත අප්‍රමාණ හැඟීම් සහ චින්තනයන් මහු විසින් අර්ථකරථනය කරගත් හේතුවලට එපිට වූ, මහු ස්වභාවිකය යැයි පවසන මිම්මටද එපිට එක්තරා උසස් ශක්තියක් බලයක් හා බැඳෙන්නේය. ඒ බැඳීම මිහිපිට සර්ව ව්‍යා පිතව පැතිරී ඇති මිනිස් සමාජය අතරද විවිධ කුල සහ වංශයන් අතරද, අනේකවිධ වෘත්තාන්ත සහ විවධ කටයුතු කෙරෙහිද, එක් එක් අවස්ථාවන්හිද ප්‍රසාරණය වී ඇති ස්ථිරසාර මතයක් මත සෘජුව රැඳී පවතින්නේය. ඒ මතය මෙම විශ්වය සහ එහි ඇති දේ නිර්මාණය කළ අති උසස් දෙවියෙකු ඇති බව වූ ස්ථිරසාර සත්‍ය විශ්වාස පද්ධතියක් වන රමාන් බව වැටහෙන්නේ පිටස්තර දැනුම් දීමකින් හෝ තොරවය.

ප්‍රන්ශයේ ප්‍රබල දාර්ශනිකයෙකු සහ විද්තතෙකු වන විද්වත් බර්ජන්ස් මෙසේ විස්තර කරයි : විද්‍යාව, කලාව, දර්ශන වාදය සහ අනෙක් විවිධ මාදිලියේ ඉගැන්වීම් සහ කලා නැතිව මිනිස් සමාජයන් ලොව සංස්ථාපනය වී අවසන් වී ගියා යැයි කිව හැකිය. එවැනි කිසිදු දර්ශනයක් මුල් නොවූ තවත් සමාජ සෘජුව ඉපදෙමින්ද මියදෙමින්ද පවතින්නේය.

අර්නස්ට රිනාවුන් නම් ප්‍රබල දාර්ශනිකයා තම විශේෂ නිර්මාණයක් වන 'දහම්වල වෘත්තාන්තය' නම් ග්‍රන්ථයේ තැනක පවසන කළ 'අප කැමැති වන සියළු දේ නැති වන සුළු මිම්මකින් නිර්මාණය වූ නිර්මාණයකි. එසේම මිනිස් ජීවිතයද විනාශ වන්නට හැකිය. එසේත් නොවේ නම් ක්‍රමිකව විනාශ මුඛයට ලඟාවිය හැකිය. තවද වෘත්තිය, දැනුම, බුද්ධිය, ඥානය සහ අන් සිප් සහ කලාව භාවිත කරන අවස්ථාව සහ නිදහසද ගිලිහී නැති වී යා හැක. නමුදු මිනිසා තුල සහජයෙන්ම උපදින අධ්‍යාත්මික හැඟීම් සහ දහමාශ්‍රයෙන්වූ

දැනුම හෝ ඥානය කිසිසේත් ඔහුගෙන් ඉවත්වී යැමට නොහැකිය. ඒ ගැන තවත් සවිස්තර කර පවසනවා නම් මේ සත්‍ය දහම හෙවත් අධ්‍යාත්මික හැඟීම, ප්‍රඥාව මිනිසාගේ මිහිපිට ජීවිතයේ පටු පාරාසයක් තුල ඔහුගේ විචාර නොකැළල් චින්තනය බැඳ තැබීමට හෝ විලංගු දමීමට හෝ නානාන ලෞකික වාදය හෝ භෞතික වාදය උපන් තැනෙහිම බෙලහීන කරන්නට, අකමකා දැමීමට උත්සාහ දරන විශාල අවියක් බව සැකෙන් තොරව පැවසිය හැකිය.

ඒ ස්වභාවික දහම නම් හුදෙක් සහජ ස්වභාවික හැඟීම් හා සම්බන්ධ හෝ ඥානය, කලාව හා සම්බන්ධ හෝ දෙයක් යැයි සීමා කර අවසන් කළ නොහැකිය. එය හැඟීම් සහ ඥානය හා මුසුවූ අඅමිල මිශ්‍රණයක් යැයි කිව හැකිය. ඒ මිශ්‍රණය විද්‍යාමාන දෙවිඳු කෙනෙකු ගැන ස්ථිරසාරව විස්තර කර විශ්වාස කිරීමේ උවමනාව ප්‍රත්‍යක්ෂ කරයි. ඒ උවමනාව මිනිස් ජීවිතය තුල කෙතෙක් දුරට නියෝජනය වන්නේ නම් ඒ උවමනාව තුලින් මේ ලොව, එහි පිහිටෙන ජීවිතයේ උන්නතිය පැහැසැරව විස්තර කළ හැකි අන්දමින්වූ සාධක සම්පූර්ණයෙන්ම මතු වී පෙනෙන්නේය. එසේම ඒ මහා දැනුම් සම්භාරය සහ එහි උවමනාව විශ්වයේ අධිපතියා වන අල්ලාහ් කෙරෙහි වූ නොවැනෙන සූළු විශ්වාසයද ඒ විශ්වාසය කෙරෙහි වූ අතිමහත් උවමනාවද සාක්ෂාත් කරන්නේය.

විශ්වයේ පවතින සියල්ල ඒ වෙනුවෙන්වූ විශේෂ කරුණක් හේතුපාදක කරගෙන ක්‍රියා වන්නේය යන්න කිසිදු සෝදිසියකින් හෝ දැනුමක් නොලබා හෝ ඒ ගැන නොහදාරා හෝ වටහා ගත හැකි බව එහි මුල් අවධියේම වූ ක්‍රියා වලියෙන්, දෘෂ්ටයෙන් සහසුද්දෙන්ම පැහැදිලි වන කරුණකි. මේ සහජ දැනුම කුමණ මාදිලියේ ක්‍රියාවක් වූවද එය කරන්නා නොවන්නට එය ක්‍රියා කරවන්නා නැතිව විය නොහැකි බව

ඥානයට, චින්තනයට සහ බුද්ධියට පහසු වෙන් වටහා ගැනීමට විශාල දැනුමක් තුලින් අධ්‍යයනය කිරීමට හෝ සුළුඹුල් අත්දැකීමක් හෝ නුවුවමනාය. එසේම කිසිදු නිෂ්පාදනයක් හෝ මැවීමක් හෝ කලා මූර්තියක් හෝ එහි නිෂ්පාදකයෙක්, මැවුම් කරුවෙක්, ශිල්පියෙක් නැතිව එළි දැකීමට හැකිය යනුවෙන් වූ අදහසක්ද පිළිගැනීමට නොහැකිය.

උදාවී ඇත්තේ සිදුවන සියල්ල කාරණාවක් හේතු කොට ගෙන සිදුවන බවට තීරණය වී ඇති මේ ප්‍රපංචයේ න්‍යාය යක් බව පිළිගැනෙනා විවෘත අවස්ථාවකි. සිදුවන සියල්ල සිදු වන්නේ කාරණා වක් හේතුපාදක කොට ගෙන දැයි සර්වබල සර්වඥාන අල්ලාහ් කෙරෙහි නොගිලිහෙන විශ්වා සයක් තබා ඇති කටුක කාන්තාර පිටිසර අරාබි වැසියෙකු ගෙන් කරුණු විමසූ කළ ඔහු අර්ථානුසාරයෙන් එයට දෙන්නේ කාහටත් අදහා ගත හැකි පහසු, අසංකීර්ණ, සරල පැහැදිලි පිළිවදනකි.

'කටුක කාන්තාරයේ දකින මටුබෙටි මටුවෙකු ඒ අවට සැරිසැරූ බව නොවන්නට එය මටුමගක් යන්න සාක්ෂාත් කරන්නේ නම් මිනිස් පා සටහන් සහ පියමන් කළ අඩයාලම් එහි ඒ මග ඔස්සේ කෙනෙකු පියමන් කළ බව හෝ සැරි සැරූ බව හෝ පැහැදිලි කරන්නේ නම් අප්‍රමාණ තාරකා සහ ග්‍රහලෝක වලින් සමන්විත මේ විශ්මිත විශ්වයද, විවිධ මාදිලියේ විශාල භූමි ප්‍රදේශයෙන් සමන්විත මහපොළොවද, නිරන් තරව වෙරළ ගැටෙන විශාල රැළිවලින් සමන්විත මහා සාගරයද ඉතා උසස් අති සූක්ෂම ඥානාන්විත සියල්ල මැවූ මහෝත්තම දෙවියෙකු සිටින බව නොඅඟවන්නේද?

මධ්‍යම යුගයේ යුරෝපයේ විසූ ප්‍රබල විද්‍යාංගයෙකු වන අයිෂක් නිවටන් මහතා මෙසේ විස්තර කරයි : විධ්‍යාමාන සියළු දැහි නිර්මාතෘ වරයෙකු සිටින බව වූ අදහසෙහි කිසි

සේත් අවිශ්වාස නොකරන්න. මන්දයත් ප්‍රභේද නොවී ක්‍රියා වෙමින් පවතින මෙම විස්තෘත විශ්මිත විශ්වය ඉබේ බිහි විය යනුවෙන් පැවසීම බුද්ධියට සහ ඥානයට කිසිසේත් අදහිය නොහැකි ඌන අදහස්වලින් සමන්විත තර්කයකි. විසිතුරු විශ්වය සහ එහි සූක්ෂම නිමවුම කෙරෙහි හුදෙක් මිනිසාගේ දෘෂ්ටිය සහ අවධානය ඇදී යන කළ ඥානාන්විත, අති බලමහිම, අති උසස්, නිර්මාතෘ වරයෙකුගෙන් තොරව එය නිර්මාණය වී ඇතැයි සිතාගත නොහැකිය යන්න සක්සුදක්සේ පැහැදිලිය. ඒ අදහස සහ චින්තනය මිනිසා තුල ඇති කරවන්නේ අතිමහත් රමාන් සංකල්පය හෙවත් අල්ලාහ් දෙවිඳු කෙරෙහි වූ උසස් විශ්වාස පද්ධතියකි.

තවත් ප්‍රබල විද්වතෙකු වන හර්ෂල් නැමැත්තා පවසන බව ස්පින්සර් තම ග්‍රන්ථයක මෙසේ විස්තර කරයි : මිනිසාගේ ඥානය වර්ධනය වන කළ, මුඟු කුරා යන කළ ආරම්භයක් නැති නිර්මාතෘ වරයෙකු ඇති බව වූ ප්‍රබල සාධකද ඔහු තුල ක්‍රමිකය ප්‍රගුණ වන්නේය. අති උත්කෘෂ්ඨ දයාන්විත අල්ලාහ් දෙවිඳුගේ ශක්තියට සහ ඥානයට සීමා වක් නැත. ගණිතඥයන් ද, අජටාකාශ ගවේශකයන්ද, පුරා වස්තු ගවේශකයන්ද, ප්‍රාණී විද්‍යාඥයන්ද, අනෙකුත් විද්ව තුන්ද ඥානයේ මහාකොටු පවුර සහ එහි ඉවුරු සකස් කිරීමේදී අදහස් හුවමාරු කරගනිමින් කෙනෙක් තවත් කෙනෙකුට පිටිවහලක් වෙමින් කරන්නේ අසහාය සේවයකි. ඒ මහා පවුරෙන් වටවූ මහා කොටුව දෙවිඳු අල්ලාහ්ගේ මහෝත්තම භාවය සහ බලමහිමය ගැන කියා පාන්නේ අති මහත් අන්දමිනි.

විද්වත් ස්පෙන්සර් මහතා තම මතයක් තවත් අවස්ථාවක මෙසේ විස්තර කරයි : ජල බින්දුවක් ගෙන පරීක්ෂණයක යෙදෙන කෙනෙකු එය හෛඩ්‍රජන් වායුවේ සහ ඔක්සිජන්

වායුවේ මිශ්‍රණයක් සංයෝගයක් ලෙස වටහා ගන්නේය. ඒ වාස්තවික මිශ්‍රණය අඩුවැඩි වන්නේ නම්, වෙනස් වන්නේ නම් එහි විපාකය ජලය වෙනුවට වෙනත් දෙයක්විය හැකිය යනුවෙන් දකින්නා, ඒ ජලය නිර්මාණ කළ නිර්මාතෘවරයාගේ සූක්ෂම ඥානය, ශක්තිය සහ බලමහිමය ගැන උසස් අන්දමින් සාක්ෂාත් කර ගන්නේය. නමුදු සාමාණ්‍ය කෙනෙකු ඒ නිමවුම හුදෙක් ජල බින්දුවක් ලෙස දකියි. මෙසේම අයිස් කැටයක සූක්ෂම විශ්මිත නිර්මාණය සහ එය නිර්මාණය පිණිස අඩංගු වී ඇති ද්‍රව්‍යයන් ගැනද තම අවධානය යොමු කරන විද්වතෙකු එහි විශ්මිත විසිතුරු නිර්මාණය ගැන අර්ථානුසාරයෙන්ම වටහා ගන්නේය. නමුදු ඒ ගැන මනා අවබෝධයක් නැති කෙනකු එය හුදෙක් සීතලෙන් මිදී ගිය ජල බින්දු කීපයක් යනුවෙන් පමණක් වටහා ගන්නේය.

තවත් ප්‍රබල විද්වතෙකු වන බේකන් මෙසේ විස්තර කරයි : මිනිසා නැනනුවණ වෙහෙසවා ලබාගත් දුළු ප්‍රමාණයේ ඥානය, චින්තනය දේව ප්‍රතික්ෂේපය කෙරෙහි, දෙවියෙක් නැත යන්නෙහි ගෙන හැර යෑමට හැකිය. නමුදු මිනිසාගේ චින්තනය සීමාවක් නොවූ නිර්මාණයන්හී මහිමය ගැනවූ දර්ශනයක ගිලී ඒ ගැන අධ්‍යයනය කරන කළ එය විශ්වයේ නිර්මාතෘ වරයෙකු වන ස්ථිරසාර දෙවියෙකු කෙරෙහි වූ ඊමාන් වෙත මිනිසා රැගෙන යන්නේය. එනම් මිනිස් චින්තනය මුණ ගැසෙන, සම්මුඛ වන නිමයක් නැති අවුල් සහගත තවත් සමහර භාහිර කරුණු හා එක් වී ක්‍රියා නෙවී මන්ද ගතියක් පෙන්නුම් කරන්නේය. ඒ භාහිර කරුණු පිටුපසේ, පසුතලයේ කුමක් තිබෙන වාදැයි මදක් උනන්දුවෙන් සොයා බැලීමට ඔබ්බට තවත් පියවරක් තැබීමට ඉදිරිපත් නොවන විට ඔහු එහි යථාර්ථය වටහා ගැනීමට අපොහොසත්

වන්නේය. එකිනෙකට සම්බන්ධවී ඇති ඒ අසහාය කරුණු ගැන හදමනස විවර කර බලන කළ එහි පිටුපස ඥානාන්විත අල්ලාහ් දෙවිඳු හැර මහුට දකින්නට අන් කිසිවක් නැත යන්න සුපැහැදිලිය.

මෙහි ඉහත සඳහන් කළ සමහර විද්වතුන්ගේ අදහස් උදහස් සහ තවත් සමහර කරුණු කෙරෙහි විවෘත සිතෙන් චින්තනය යොමු කළ අය එහි ගිලී ගිය අවස්ථාවන් ගැනවූ නොගිලිහෙන සාක්ෂි තුලින් විශ්වය තුල ඇති අනේකවිධ නිර්මාණයන්හී අසහාය නිර්මාණත්වය සහ එහි ප්‍රමුඛයා, නිර්මාතෘ වරයා ගැන මනාව වටහා ගැනීමට හැකි අවස්ථා අපමණ බව කිව හැකිය. නමුදු විද්වත් බෙකන් කරුණු විස්තර කරන අන්දමට අවිශ්වාසය සහ ප්‍රතික්ෂේප කිරීම මිනිසා තුල වැඩෙන්නේ ඔවුන් අවධානමෙන් තොර කළ චින්තනයන් සහ කළ අධ්‍යයනය තුලින් ලද කරුණුවලින් හෝ දැනුමෙන් සාක්ෂාත් කරගත් ඌන ප්‍රතිඵලයක් බව කියයි. ඒ විද්වතුන්ගේ ක්ෂණික සාධක සහ සුළු පාරාසයක් තුල කළ භාෂිතය අවසානවයේ මිනිසා ප්‍රතික්ෂේප කිරීම සහ නොමග යැමට මං පෙත් කපන්නේය.

සැබැවින්ම අල්ලාහ් දෙවිඳු කෙරෙහි විශ්වාස කිරීම හුදෙක් හැගෙන්නන් වාලේ වටහා ගැනීමට වෙර දරන හැඟීමක් නොව. එය ඥානයට මිනිස බුද්ධියට සමාධි ගත වූවකි. අල්ලාහ් කෙරෙහි වූ ස්ථිර විශ්වාසයක් නොවන්නට මෙම පැනයට පිළිවදන් සොයා යමේදී මිනිසා නොමග යැවීම නොවළක්විය හැකි කරුණකි. මෙසේ ඒ පැනයට පිළිවදන සොයා ගෙන යන්නා නොමග නොයන අයුරු අනතුරු අඟවමින් අල්කුර්ආනය මෙසේ විස්තර කරයි : *'නොවන්නට ඔවුන් නිර්මාපකයෙක් නොමැතිව නිර්මාණය කරනු ලැබුවාහුද?*

*නැතිනම් ඔවුහුම නිර්මාපක යෝද? හෝ ඔවුන් අහස්ද මහපොළොවද නිර්මාණය කළහුද?'* (52 : 35 -36)
විශ්වය සහ එහි තුල ඇති සියළු දේ කිසිවකින් තොර ස්වම ක්ෂණික නිර්මාණය නොවිය. කිට්ටු සම්බන්ධකමක් පවත් වමින් එකක් තවත් එකකට පිටිවහල් වෙමින් නිර්මාණය වූයේද නැත. ඒවා කිසිදු භාහිර බලපෑමකින් තොරව තමා, තමා විසින්ම නිර්මාණය කර ගත්තේද නැත. මෙම විසිතුරු විශ්වය සහ ඒවා තුල ඇති ඒවාද තමා විසින් නිර්මාණය කළ බව ඒ අරභයා අයිතිවාසි කම් ඉල්ලූ කෙනෙක්ද නැත. එසේම මින්මතු එසේ අයිතිවාසිකම් ඉල්ලා සිටීමට කිසිවෙකුට නොහැකිය. ඔවුන්ට පෙර හෝ පසුව හෝ කෙනෙකුද එසේ උරුම කම් අයැදුවේ නැත. එසේ නම් අප ඉදිරියේ ප්‍රසාරණය වී ඇති අති විශාල ප්‍රශ්ණය සහ කුකුස, ඒවායේ නිර්මාතෘ වරයා සහ එහි අයිතිකරුවා කවරෙක්ද යන්න තෝරාබේරා අව්‍යාජ පිළිවදන් සෙවීමකි.

විවිධ ආරයෙන් සන්සන්දනය කර බලන කළ මේ එකම පෑණයට ඇත්තේ එකම පැහැදිලි පිළිවදනකි. ඒ පිළිවදන හැර වෙනත් පිළිතුරක් කිසිවෙකු වෙත නැත. එසේම මිනිසා තම චින්තනය හා කතා කරන්නට හෝ වාද කරන්නට හැරියානම් එහිද මේ එකම පිළිතුර හැර අන් පිළිවදනක් ඔහුගේ හදමනස තුල පිබිදෙන්නේද නැත. *අහස්ද පොළො වද නිර්මාණය කළේ කවරෙක්දැයි ඔබ ඔවුන්ගෙන් ප්‍රශ්න කළේ නම් ඒවා නිර්මාණය කළේ බලසම්පන්න සියල්ල දන්නා (අල්ලාහ්) ය යනුවෙන් ඔවුන් කියන්නෝමය'*. (43 : 9)

මා යා යුත්තේ කොයිබටද කුමන දිසාවටද?

මා යා යුතු දිසාව කුමක්ද යන මෙම දෙවැනි පැනයට සියල්ලට ස්වභාවය, සහජත්වය හේතු වේ යනුවෙන් විවෘතව උත්තර සපයන සමාජය ඒ ගැන මතුවටත් පැහැදිලි කිරී

මේදී අනෙකුත්, නිර්මාණය වඩා සම්භාවණයට පත්කර ඇති ගවේශනය දයාදය ලෙස ලබාගත් මිනිසා මෙම පැනයට උත්තර දෙන්නේ මිනිසා අතිශයින්ම සත්ත්වයාටත් ඉතා පහත් නිහීන අන්දමින් තක්සේරු කර මිනි. ඔවුන් මෙසේද විස්තර කරයි : මිහිපිට ජීවය ලබා සැරිසරන මිනිසා සසර ජීවත්වී ඔහුගේ ආයු කාලය අවසන් වී මරණයට පත් වී මිහිදන් වූවාට පසු කය මහපොළොවට එක්වී විනාශ වී පස් බවට පත්වී යන්නේය. එවිට මිනිසාගේ ඒ ස්ථූල දේහයේ වෘත්තාන්තයද සදහටම අවසන් වන්නේය. ඉතික්පිති ඒ දේහයට හෝ ඒ තුල පෙර අරක් ගෙන තිබුණු ජීවයට හෝ කිසිදු පැවැත්මක් නැත. මරණෙන් මතු එලොව ජීවිතයද, එහි එලවිපාකයද මිනිසාගේ සිත බැඳ තබා ගැනීම පිණිස ප්‍රබන්ධ කර පවසන ලද මනෝමික මුසාවක් මිස අන් වැදගත් දෙයක් නොව.

මිනිසාගේ සම්භවය සහ ඔහුගේ මිහිපිට ජීවිතයේ හරය මරණයත් සමගම මෙසේ අවසන් වන බව ඒ දාර්ශනිකය න්ගේ මතය වේ. මෙවුන් පවසන මේ කාල්පනික අදහස එහි සහ අවසන් විසඳුම ගැන ගණනය කර මිහිපිට වසන මිනිස් සමාජයේ ජීවිතය ගැන මදක් සිතා බලමු. ඔවුන්ගේ ඒ සාතිශය අදහස් අනුව අප ව්‍යපේදනය කොට නිගමණ යකට පත් විය යුත්තේ මිහිපිට මිනිසා මැරී මිහිදන් වූවාට පසු ඔහු පස් හා සංයෝගය වී නැත්තටම නැතිවී විනාශ වී යන්නේය යනුවෙනි. තවද ඔවුන් මිහිපිට ජීවත් වූ කාලය තුලය කළ කටයුතු සුදන හෝ වේවා දුදන හෝ වේවා හොඳ හෝ නරක හෝ වේවා ඒවා කිසිදු විමසීමකින් තොරව මනෝඥ හෝ අමනෝඥ එල විපාකයකින් තොරව අනිවාර්තේ අවසන් වන්නේය.

ඔවුන්ගේ මෙවන් විෂම අදහස අනුව උදාවන සියලු තත්ත්වයන් සහ අවස්ථාවන් පාංසාම මිහිපිට වසන මිනිස් සම්පත්තිය කිසිදු ඵලප්‍රයෝජනයක් හෝ සම්භාවණත්වයක් හෝ නොලබා මිහිපිට ජීවත් වන කළ කෙසේ හෝ ජීවත්වී මියගිය හැකිය යන මුග්ධ තීරණයකට සහ අර්ථශූන්‍ය අඳුරු ආගාධයක් සඳහා වූ චින්තනයකට මිනිසා පත් කරන්නේය. තවද ඒ නිරර්ථක මතය අනුව තම අති උත්තම නිර්මාතෘ වරයා වන අල්ලාහ් දෙවිඳුගේ අණපනත් වචනයේ පරිසමාප්ත අන්දමින්ම පිළිගෙන ඒ අනුව සදා බැතියෙන් නෙත්සිත් සනහාලන ශ්‍රධාවෙන් ජීවත්වූ කෙනාද අල්ලාහ් දෙවිඳුගේ ආඥාවන් උදාසීන කර පිටුදැක තම හදමනසට වහල් වී අත්තනෝමතික අන්දමින් ජීවත්වූ කෙනාද අවසා නයේ කිසිදු වෙනසකින් තොරව එක සමාන තත්ත්වයකට පත් වන්නේය. එසේම මිනිසාට සේවය කරමින් සමාජයේ මිනැඑපාකම් සපුරාලමින් පිටස්තරයන් වෙනුවෙන් පරාර්ථ කාමීව තම ජීවිතයේ ලැබෙන එක්එක් අවස්ථාව උදෙසාම කැප කරමින් බැතියුත් සංසාර ගමණක් ගැන සිතා ඒ ඉලක්කය සාක්ෂාත් කරගනු වස් කෘතවේදීව කටයුතු කළ තැනැත්තාද, තම ආත්මාර්තය හා බැඳුණු දැඩි මමායතනය මුල් කරගත් උවමනාව පමණක් ඉලක්කය කරගෙන මත දොළ පිනවමින් මිනිස් භාවේ දුෂ්කරත්වයක් ගැන නොසළකා කට යුතු කළ තැනැත්තාද විපරීතයෙන් තොර එක හා සමාන වන්නේය. මොවුන්ගේ මේ පණ්ඩිතමානී අදහස් බුද්ධියකින්, අවංක මනසක් තුලින් ගලා බස්නා ඍජු චින්තන වාදියෙකුට හෝ හික්මීමකින් සැදුණු කිසිදු කෙනෙකුට හෝ පිළිගත හැකිද? මෙවන් අදහසක් නිකුත් කිරීමට මවුන් ඉදිරිපත් වන්නේ කුමන සාරධර්ම සිතක්, බුද්ධියක් තමා සතු කරගෙනද යන්න මහත් ප්‍රහේළිකාවකි.

ඔවුන්ගේ ඒ කුහුල දනවන අදහස් උදහස්වලට අනුගතව මිනිසාගේ අවසානය නිම වෙ නම් නොවන්නට මරණෙන් පසු පසට හවුල් වී නැත්තටම නැති වී යන්නේ නම් විශ්වයේ ප්‍රසාරණය වී ඇති නිර්මාණයන් අතරින් මිනිස් සමාජය මිහිපිට උත්පාදන කළ උසස් සම්භාවණීය සමාජයක් ලෙස හඳුනා ගන්නේ කෙසේද? මිනිසාට දුන් ඔවදන් සහ ධර්මානුශාසනාවන් අනුවණයේ මූර්තියක් විය හැකි නොවේද? එසේම මිනිසා මිහිපිට ජීවත්වන තාක් කල් මිහිපිට ව්‍යාප්තව පවතින සියලු සම්පත් ඔහු සතු කර දුන් අරමුණ කුමක්ද? සර්වඥාන අල්ලාහ් දෙවිඳු තම අන් කිසිදු මැවුමකට නොදුන් ඥානය සහ අවංක පිරිසිදු චේතනාවෙන් හෙබි චින්තන, අදහස් වැනි වටිනා වස්තු සම්භාර මේ මිනිසාට පමණක් පිරිනැමුවෙ කුමන අරමුණක් උදෙසාද? එක්තරා කාල පරිච්ජේදයක් පමණක් මිහිපිට ජීවත්වී මියදී, මිහිදන් වූවාට පසු, පස හා සම්මිශ්‍රණය වන්නේය යනුවෙන් යථාර්ථයක්, නිගමණයක් වෙ නම් මිහිපිට විද්‍යාමාන අනෙකුත් නිර්මාණයන්ට වඩා මිනිසා ප්‍රමුඛත්වයට පත් කර සම්භාවණයට භාජනය කරන ලද්දේ කුමන හේතුවක් නිසාද? මෙවන් අප්‍රමාණ ප්‍රශ්නවලට පිළිවදන් දිය යුත්තේද උඩින් පල්ලෙන් අදහස් ප්‍රකාශ කළ එවන් විද්වතුන් විසින්ම බව කෙසේ බලාපොරොත්තු වන්නද?

මොවුන් මෙසේ කුතර්කව අදහස් ඉදිරිපත් කරමින් පසුවන කළ මරණෙන් පසු මිනිසාට අත්වන ඉරණම කුමක්ද යන පැනයට සම්පූර්ණ උත්තර දැන ගෙන සිටින්නේ නිත්‍ය වශයෙන්ම සර්වඥාන සර්වබල අල්ලාහ් දෙවිඳු සහ ඔහුගේ වක්තෘ වරයා වන මුහම්මද් නබි තුමාද ස්ථිරසාරව විශ්වාස කර පිළිගෙන ඔහුගේ නීතිරීතිවලට කීකරු වී යටත්පහත් වී ඒ අනුව කටයුතු කරන ශ්‍රද්ධාවන්තයන් පමණි. ඒ යථාර්ථ

සංකල්පය සුබාවබෝධ කරගෙන, විශ්මිත මහපොළොව සහ එහි අසංඛ්‍යාත නිර්මාණයන්ද තමා වෙනුවෙන් නිර්මාණය වී ඇත යන යථාර්ථය මිනිසා වටහා ගෙන සිටිනවා පමණක් නොව ඒවා වෙනුවෙන්, ඒවාට යටත් වීමට තමා නිර්මාණය නොවූ බවද, හෙතෙම තම නිර්මාණයේ ප්‍රඥාව සහ ප්‍රඥප්තිය ස්ථිරසාරව වටහා ගෙන සිටී.

මෙම මහපොළොවේ මිනිසාගේ ජීවිත පැවැත්මේ ප්‍රධාන භාරය වන්නේ සසර වසන ජීවිතය යහමගේ, යහමින්, යථා ධර්මාශ්‍රයෙන් වූ ඉලක්කයක් ලෙස සාක්ෂාත් කරගනු වස්, නිර්මාණයේ සම්පූර්ණත්වය වෙත ලඟාවනු වස්, මරණෙන් පසු මිනිසා ලැබිය හැකි අවසානයක් නැති අසහාය ජීවිතය වෙනුවෙන් පූර්ව සූදානම් වීමකි. එසේම අවසානයක් නැති ඒ එලොව ජීවිතය වෙනුවෙන් විනා අන් කිසිදු හේතුවක් උදෙසා මිනිසා නිර්මාණය නොවිය යන යථාර්ථයද මහු අර්ථානුසාරයෙන්ම දැනගෙන සිටී. එහෙයින් මිහිපිටඇති අනන්ත අප්‍රමාණ කම්සැප සුවය සහ අනෙකුත් ලෞකික පහසුකම් කෙරෙහි සිත යොමු කර එහි ආකර්ෂ ද්‍රව්‍යයන් මත වැටී එහි මෝහනය කෙරෙහි හදමනස ඇලී සිටීමට ඉඩ දීමෙන් වැළකී අප මරණෙන් පසු ලඟාවීමට බලාපොරොත්තු වන ඒ නිත්‍ය ජීවනය තමා සතු කර ගැනීමට කුමක් අවශ්‍ය දෝ එය ඉලක්කය කොට ගෙන කාර්යක්ෂමව අප ජීවන මග සකස් කර ගත යුතුව ඇත.

ඒ අදහස ගැන සැකෙවින් පවසනවා නම් සසර ජීවිතයෙන් එතෙර වී භාවෝපගත වීමෙන් පසු කරුණාන්විත අල්ලාහ් දෙවිඳුගේ සමීපතම හිතවතුන් සහ අල්ලාහ්ගේ අනුග්‍රහය, තෘප්තිය සහ ප්‍රියමනාපයට ලක් වූවන් හැර අන් කිසිවෙකු ලබාගත නොහැකි භාග්‍යයන්, වරප්‍රසාධයන්ගෙන් පිරී සකල සුසැපෙන් සමන්විත උසස් ස්වර්ගයට තමාද ඇතුල් විය

යුතුය යන එකම අභිලාෂයෙන් ඒ සංකල්පය ආත්මගත කරගෙන මිනිසා කටයුතු කළ යුතුය. එසේ කටයුතු කිරීමට නම්, ඒ වරප්‍රසාධ පිරිනැමීමට සූදානමින් සිටින දයාබර අල්ලාහ් දෙවිඳුගේ අනපනත් සහ ආඥාවන් හට පිරිසිදු චේථනාව මුල්කරගෙන සම්පූර්ණයෙන්ම කීකරු වී යටත් වී ඒ අනුව කටයුතු කිරීමට වග බලාගත යුතුව ඇත. ඒ අදහස සම්පින්ඩණය කරගෙන කටයුතු කරන විට එහි විශේෂිත ප්‍රතිවිපාකය වන්නේ කිසිදු ඇසක් නොදුටු, කිසිදු සවනක් නොඇසූ, කිසිවක විසින් විස්තර කළ නොහැකි ස්වර්ගය වේ. ඒ දරුණු අවසන් විනිශ්චය දිනයේ සියලු විමසීම් අවසන් වූ පසු උසස් ස්වර්ගයට වරම් ලද අය සම්භාවණීය අන්දමින් පිළිගනු වස් ස්වර්ගයේ ආරක්ෂකයන් එහි පිවිසීමට වරම් ලද්දන් අති සම්භාවණීය අන්දමින් අමතන බව අල්ලාහ් දෙවිඳුගේ සුරවදන වන අල්කුර්ආනයම මෙසේ පිළිවදන් දෙයි.

*(තවද එහි ආරක්ෂකයන් එහි පැමිණ) ඔබට සදා සාමය වේවා. ඔබලා (සවර්ගය වෙනුවෙන්) සුචද ලද්දවුන්ය. ඔබ එහි සදා වෙසෙනු වස් ඇතුළු වව්.* (39 : 73)

මෙම මහපොළොව සැකසුරුවමෙන් නිර්මාණය කර එහි අනෙකුත් නිර්මාණයන්ද නිර්මාණය කර ඒවාට වූ ප්‍රමාණය, නීතිරීතින්, නියදියන් සහ කාලය වැනි සියල්ල නියම කර එහි තුල වසන්නන් තම ආධිපත්‍ය තුලට ඇතුල් කර පාලනය කරමින් පසුවන අතිඋත්තම අල්ලාහ් දෙවිඳු ඔහුගේ පාලනය තුල කිසිවෙකුට අඹමල් රේණුවක තරම් අයුක්තියක් හෝ අසාධාරණයක් හෝ නොකරන්නේය යන්න අප මනාව වටහා ගත යුතුව ඇති කරුණකි. මන්දයත් අල්ලාහ් දෙවිඳු අති කාරුණික අති දයාන්විතයාය. නමුදු සියල්ල ස්වභාව ධර්මයේ නියදිය මත ක්‍රියා කරන්නේය යනුවෙන් දර්ශකයක්

මනෝමූලිකව දොඩමලු වන වදන ගණනය කර බලන කළ මිහිපිට පැතිරී ඇති අල්ලාහ් දෙවිඳුගේ නිර්මාණයන්ගෙන් සොරකමේ කරන්නන්ද, තමාට අයිතියක් නැති අය අයුක්ති සහගතව ඝාතනය කරමින් අනිවාර්යෙන් ලේ හලමින් ජීවත් වන්නන්ද, තම සහෝදර ජනයන්ට සහ අල්ලාහ්ගේ අනෙකුත් අහිංසක මැවීම් හා අයුක්තියෙන් සහ හිංසා සහගතව ප්‍රචන්ඩත්වයෙන් සහ සාහසිකත්වයෙන් කටයුතු කරන්නන්ද මවුන් කළ දූදන ක්‍රියාවන් සහ අරාජක ක්‍රියාවන් වෙනුවෙන් යුක්තිගරුකව විමසා මවුන් හට සුදුසු දඬුවම් නොදී මවුන්ගේ මරණයෙන් පසු මවුන් පස හා සම්මිශ්‍රණය වී විනාශ වී යන්නේය යනුවෙන් තීරණය කරන කළ, තමාට එකම පිටිවහළ අල්ලාහ් වේ, අපට යුක්තිය බලාපොරොත්තු විය හැකි එකම දිසාව අල්ලාහ් වෙතින් පමණකි යන ස්ථිර විශ්වාසයෙන් මහුට කෙරෙන සියලු අයුක්ති සහ කරදර ඉවසා ගෙන කටයුතු කරන්නාට නියම ලෙසින් යුක්තිය ඉටු නොකරද, සමාජය විනාශ අභිමුඛයට ඇදගෙන යන අයුක්තියට එරෙහිව අනන්ත අප්‍රමාණ දුක් කරදරවලට මුහුණ දෙමින් කටයුතු කරන්නන් හට මවුන්ට ඒ වෙනුවෙන් වූ එල විපාක ලබා නොදීමද, යුක්තිකරුකව කටයුතු කරන පරම දයාලු අල්ලාහ් දෙවිඳු විසින් කරන විශාල අකටයුත්තක් අසාධාරණයක් නොවේද යනුවෙන් වරදවා නිගමණය කිරීමට බොහෝ සාධක තිබේ.

මවුන්ගේ මතය අනුව මිනිසා මරණෙන් පසු කිසිදු විමසීම කින් තොරව පසට මිශ්‍රවී විනාශයට පත්වනු ඇතැයි යනුවෙන් වූ සංකල්පයක්, නියමයක් වේ නම්, යුක්තිගරුක අල්ලාහ් දෙවිඳු විසින් අහස, පොළොව සහ ඒවා අතර වූ සියලු දැය මැවීමේ ඉලක්කය කිසිදු අරමුණකින් තොර වූ ක්‍රියාවක් යන තීරණයකට පත්වන්නට ඇති සාධක බහුල වන්නේය. නමුදු

අති දයාන්විත අල්ලාහ් දෙවිඳු මවුන් පවසන ඒ අමූලික අදහ සෙන් ඇත්වුනු අති පිරිසිදු, ක්‍රියාවන් හට ඵලවිපාක ලබා දෙන්නාය. නමුදු මිනිසා කිසි සේත් විනාශයට පත් වන්නේ නැත යන අසාධය මත මත ජීවත්වන ඒ මතවාදීන් දරන අමූලික අදහසට පටහැනිව මිනිසා ජීවිතක්ෂයට පත්වී කවදා හෝ එළඹෙන අවසාන විනිශ්චය දිනයේ මවුන් නැවත පන පොවා එක්රැස් කර මවුන් සසර වසන කළ ක්‍රියාවන් ගැන විමසා එයට ප්‍රති විපාක ලබා දෙනු ඇත යනුවෙන් අල්ලාහ් දෙවිඳුම පිළිවදන් දෙයි. ඒ අදහස පැහැදිලිව සාක්ෂාත් වනු වස් අල්කුර් ආනයම බොහෝ තන්හී සඳහන් කරයි.

*'අප ඔබ නිර්මාණය කළේ නිකමින් බවත් ඔබලා (මරණෙන් පසු) ආපසු අප වෙත නොපැමිණෙන බවත් ගණනය කරමින් පසුවනවාද? සත්‍ය හිමියන් වූ අල්ලාහ් දෙවිඳු අති උත්කෘෂ්ඨය'.* (23 : 115 - 116)

මරණෙන් මතුව එළඹෙන අවසානයක් නැති එලොව ජීවිතයේ මුල්ම කටයුත්ත මවුන් කළ කටයුත්තන් ගැනවූ විමසීම බව නවත් අල්කුර්ආනය මෙසේ සාධකව පවසයි :

*'(පරමාත්තයේ කිසිදු විමසීමකින් තොරව) නිකමින් අත් හරිනු ලබනු ඇතැයි මිනිසා සිතන්නේද?'* (75 : 36)

මිනිසාගේ ලෞකික ජීවිතයේ මවුන්ගේ එක්එක් ක්‍රියාවන් අනුව මරණෙන් මතු මවුන්ගේ තත්ත්වයද විවිධ පියවර ඇති බව මතු සඳහන් අල්කුර්ආන් වැකිය පහන් කරයි :

*('යහකම් කළ අය නපුරුකම් කළ අය මෙන් අප පත් කර මුදැයි මවුන් සිතන්නේද? මවුන් ජීවත් වීමද මරණයට පත්වීම එක හා සමානය. මවුන් මෙයට පටහැනිව තීරණය කර ගැනීම අති නපුරුය. අහස් සහ පොළොව අල්ලාහ් සත්‍ය කාරණය කොට (සහේතුක කර) ගෙන නිර්මාණය කළේය. නවද සෑම කෙනෙකුම මවුන් (සසර ක්‍රියාවන්ගෙන්) උපයා ගත් දෑ වෙනු*

*වට ඵලවිපාක දෙනු වස් (මහු මිනිසා) නිර්මාණය කළේය. ඔවුහු කිසිසේත් අන්‍යාය නොකරනු ලබනු ඇත.* (45 : 21 - 22)

මරණින් මතු ජීවිතයක් නැත අප ජීවත්වන මේ මිහිපිට ජීවිතය මිනිසාගේ එකම ජීවත්වන ස්ථානය වේ යනුවෙන් හුදෙක් මනෝමය අදහස්වලින් සිත පුරවාගෙන වැඩකට නැති හිස්බසින් අල්ලාහ් දෙවිඳුගේ වදන් ප්‍රතික්ෂේප කරන්නන් සහ දොඩමලු වන ප්‍රඥංගුරයන්ට අනතුරු අඟවා අල්කුර්ආනය මෙසේ විස්තර කරයි : *අහස පොළොව සහ ඒවා දෙක අතර වූ දේ අප අනිවාර්තේ නොමැවුවෙමු. මේවා (අල්ලාහ් දෙවිඳු) ප්‍රතික්ෂේප කරන්නන්ගේ නිගමණය වේ. එහෙයින් එසේ ප්‍රතික්ෂේප කරන්නන් හට(සූදානම් කර ඇත්තේ) නිරයේ ගින්නේ විපතයි. නොවන්නට ස්ථිරව විශ්වාස කර යහකම් කළ අය භූමියෙහි අපරාධ කළවුන් සේ කරන්නෙමුද? හෝ බියබැතියන් (දැමිටුකම් කළ) දුමග ගියවුන්සේ කරන්නෙමුද?* (38 : 27 - 28) *අපි අහස්ද පොළොවද ඒ දෙක අතර වූ දෑද කිසිදු කරුණක් නැතිව විනෝදෙට නිර්මාණය නොකළෙමු. අප සත්‍ය කාරණය කොටගෙන මිස ඒ දෙක නිර්මාණය නොකළෙමුග එහෙත් ඔවුන්ගෙන් වැඩි දෙනෙක් එය නොදනිත්ග සැබැවින්ම (ඵලවිපාක ලබන) විනිශ්චය දිනය ඔවුන්ට නියමිත වාරය වේ.* (44 : 38 - 40)

## මිනිස් නිර්මාණයේ ඉලක්කය

තමා අල්ලාහ් දෙවිඳු විසින් නිර්මාණය කර මිහිපිට සියළු සම්පත් භුක්ති විඳිමින් ජීවත්වන සම්භාවණීය මිනිසෙක් බව වටහා ගන්නා කෙනෙකු තමාගෙන් විමසා ගත යුතු අනෙක් වැදගත් ප්‍රශ්නය නම් තමා කුමන හේතුවක් උදෙසා නිර්මාණය වීද යන්නයි. ඒ ප්‍රශ්නයම තමා නිර්මාණය වූයේ කුමන හේතුවක් නිසාද යනුවෙන් ප්‍රශ්න කළ හැකිය. විශ්වයේ ව්‍යාප්තව ඇති අනෙක් මැවීම්වලට වඩා අති උසස්

අන්දමින් තමාට විශේෂ හැකියාවන් ලබා දී සත්‍ය අසත්‍ය තෝරාබේරා වටහා ගන්නට තරම් සිතක් දී නිර්මාණය කර උසස් තත්ත්වයකට පත්කර ඇත්තේ මක්නිසාද? එහෙයින් මිහිපිට මා විසින් ඉටු කළ යුතු අසහාය යුතුකම් මොනවාද? මගේ වගකීම් මොනවාද? යනුවෙන් අසා පිළිවදන් සෙවිය යුතු මිනිසා ඉදිරියෙහි දිග ඇරෙනා ප්‍රශ්න වැලකි.

ඉහත සඳහන් ප්‍රශ්නවලට පිළිවදන් මනාව ලබා ගෙන හෝ දැනගෙන හෝ සිටින්නේ අල්ලාහ් ගැන ස්ථිරසාර දැනුමක් සාක්ෂාත් කරගත් සත්‍ය විශ්වාස වන්තයෙකු පමණි. යමෙකු යම් භාණ්ඩයක් නිෂ්පාදනය කරවා යැයි සිතමු. ඔහු එය නිෂ්පාදනය කරනවිට එය නිෂ්පාදනය කරන්නේ කුමක් පිණිසද, එහි අරමුණ කුමක්ද යන ප්‍රශ්නයටද උත්තරයක් තමා තුල සූදානම් කරගෙන සිටී. මන්දයත් ඔහු එය නිෂ්පාදනය කරන්නේ යම් විශේෂිතව අරමුණක් උදෙසාය.

මිහිපිට වසන මෙවන් සාමාන්‍ය මිනිසා පවා යමක් කිරීමේ දී ප්‍රයෝජනවත් අන්දමින් එහි ප්‍රතිවිපාකය අරමුණ කොට ගෙන අවධානමෙන් සැළැස්මක් අනුව කටයුතු කරන විට සූක්ෂම අන්දමින් තීරණය කර ක්‍රමිකව කටයුතු කිරීමට මනා චින්තනයක් ලබාදුන් ඔහුගේ දෙවිඳු කොපමණ සූක්ෂම ලෙස මිනිසා නිර්මාණය කළේ දැයි සිතා බැලිය යුතුය. එහෙයින් එක්තරා විශේෂ අරමුණක් උදෙසා මිනිසා නිර්මාණය කළ දෙවිඳුන් ඒ මිනිසා මිහිපිට ජීවත්වීමට අවශ්‍ය සියලු පහසු කම් සහ ආම්පන්නද ලබා දී, තවද ඔහු විසින් නිර්මාණය කරන ලද අනෙකුත් සමහර දෑ ද ඔහු යටතට පත් කර ඔහුට සතුකර දී, ඔහු මිහිපිට ජීවත්විය යුතු ආකාරයද එයට අධාල නීතිරීතිද තීරණය කර පහදා දී යුක්ති ගරුකව දයාන්විතය පාලනය කරමින් පසු වන්නේය.

මිනිසා තමා නිර්මාණය කළ අති දයාන්විත කරුණාන්විත දෙවිඳුගෙන්ම 'දෙවියනි, ඔබ කුමන හේතුවක් උදෙසා මිනිස් සමාජය නිර්මාණය කළෙහිද? ආහාරපාන භුක්ති විඳ කුමාර කම්සැප සුවය භුක්ති විඳිමින් සතුටු වීමට ඔබ මිනිසා නිර් මාණය කළාද? නොවන්නට සිත්සේ චින්තනය හසුරුවා කෙලිලොලෙහි, කතාබහෙහි නිරත වෙමින් අනිවාර්යේ කාලය කා දමා අවසානයේ මරණය තුරුළු කර ගන්නට නිර්මාණය කළාද? එසේ නොවන්නට මහපොළොවේ අට දික් භාගයේ ගමන් කර තමා කැමැති සියලු දර්ශන දැක බලා නෙත්සිත් පිනවා, තමාට ලැබෙන සියළු දේ අනුභව කළ හැකි යැයි පානය කළ හැකි යැයි සිතා සියල්ල කාබී සතුටු වී අවසානයේ නිර්වින්දනය වී මරණයට පත්ව මිහිදන් වී පස් බවට පත් වන්නටද? එසේත් නොවන්නට තමා මිහිපිට ජීවත්වන තාක් කල් අපමණ දුක්කම්කටොලු වලට මැදිවී ජීවත් වී සෝසුසුමෙන් මියදෙන්නටද? අති සම්භාවණීය මිනිසා නිර්මාණය කරන ලද්දේ ඉහත සඳහන් අයුරු මිහිපිට ජීවත්වී මැරී යන්නට නම් එක්එක් කටයුතු ක්‍රියාවෙහි යෙදෙන අවස්ථාවේ මඟුට පිරිනමා ඇති ඥානය හසුරුවා සමීක්ෂණ කර තෝරාබේරා ගෙන කටයුතු කිරීමේ වැදගත් කම කුමක් උදෙසාද' යන්න මදක් විමසිය යුතු පැනයකි.

ඉහත නගන ලද ප්‍රශ්නවලට මනා උත්තරය අල්ලාහ් දෙවිඳු විසින් මුල්ම මිනිසා වන ආදම් නිර්මාණය කරන්නට පෙරම පරිසමාප්ත අන්දමින්ම තීරණය කර මුල්ම මිනිසා නිර්මාණය කරන්නට පෙර අල්ලාහ් තම නිර්මාණය ගැන තමාට ගරු බුහුමන් කරමින් තමා අසලම වාගේ වැජඹුණු සුරදූතයන් වෙත දැනුම් දීමේදී මිහිපිට ව්‍යාප්ත වී පාලනය කරමින් වසන මිනිස් සමාජයක් ඇති කිරීමට තීරණය කර ඇති බව විස්තර කළේය. ඒ ගැන අල්ලාහ් දෙවිඳුම අල්කුර්ආනයේ

*මෙසේ විස්තර කරයි:(නබි තුමනි) ඔබ දෙවිඳු සුරදූතයන් අමතා 'ඇත්තෙන්ම මම පොළොව මත පාලනය කර භුක්ති විඳින (මිනිස් සමාජයේ) කෙනෙකු පත් කරමි' යනුවෙන් පැවසූ විට '(දෙවියනි) එහි දුෂ්ටකම් කරන්නා වූද, ලේ වගුරු වන්නා වූද කෙනෙකුද ඔබ එහි පත් කරන්නේ? අප ඔබගේ ප්‍රශංසාවෙන් ඔබ (සදා අවංකව) සුවිසුද්ධ කර මින් පසුවන අය වෙමු' යි සුර දූතයන් කීවෝය. එයට 'ඔබ නොදන්නා දේ මම දනිමි' යනුවෙන් (අල්ලාහ් දෙවිඳු වන) ඔහු (සුර දූතයන් අමතා පැහැදිලිව) කීවේය.* (2 : 30)

අල්ලාහ් දෙවිඳු පරිශුද්ධ අල්කුර්ආනය තුලින් විස්තර කළ මිහිපිට ජීවත්වන්නට යෝජනා කර ඇති ඒ නියෝජනයේ මුල් අවදිය සහ පිවිතුරු ඉලක්කය කුමක් වේ නම් තමා ගේ නිර්මාතෘ වරයා කවරෙක්ද යනුවෙන් තේරාබේරා වටහා ගෙන තම මාපකයා තමාගෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද, ඔහු තමාට කුමක් අණ කර ඇත්දෝ, තමා මිහිපිට ජීවත් වන තාක් කල් කෙසේ ජීවත් විය යුතුය යනුවෙන් ආඥා කර ඇත්දෝ ඒවා අවබෝධාත්මකව වටහා ගෙන යථාර්ථ අන්දමින් ඔහුට සම්පූර්ණයෙන්ම කීකරු වී ජීවත්වීම වේ. ඒ හැර මිනිස් සම්භවයේ ඉලක්කය අන් කිසිදු අරමුණක් හේතු කොටගෙන නොවේ. ඒ ගැන අල්ලාහ් දෙවිඳු පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි.

*(විශ්මිත) සප්ත අහස්ද, මහපොළොවෙන් ඒහා සමාන ද අති සූක්ෂම අන්දමින් නිර්මාණය කළේ අල්ලාහ්ය. සැබැවින්ම අල්ලාහ් සියලු දැය කෙරෙහි බලසම්පන්නය යන්නද අල්ලාහ් සියලු දැය හාත්පසින්ම දන්නේමය යන්නද ඔබ දැන ගනු වස් ඒ (අහස් සහ පොළෝ) අතර (ඔහුගේ) අනපනත් පහළ වන්නේය.* (65 : 12)

එහෙයින් මිනිසා අල්ලාහ් දෙවිඳු විසින් නිර්මාණය කරන ලද අහස් තලය, මහපොළොව සහ එහි ව්‍යාප්තව පවතින විවිධ දේ නිර්මාණය කළ මුඛ්‍ය හේතුව, ඔහුගේ තවත් සූක්ෂම නිර්මාණ වන මිනිස් සහ ජින් සමූහය සහ ඒවායේ නිර්මාණත්වයේ උත්කෘෂ්ටත්වය, බලමහිමය, එවන් අනර්ඝ නිර්මාණ වෙනුවෙන් විය යුතු ඥානය සහ බලය ගැන මනාව වටහා ගත යුතුය. එසේ වටහා ගන්නවා පමණක් නොව, ඒවායේ ඉලක්කය සහ අරමුණ ගැනද වටහා ගත යුතුය. එසේ ඒ ගැන මනාව වටහා ගැනීමෙන් අල්ලාහ්ගේ මැවීමේ ශ්‍රේෂ්ටත්වය සහ ඔහුගේ මහෝත්තම භාවය මනාව වටහා ගත හැකි බව ඉහත විස්තර කරන ලද ශුද්ධවූ අල්කුර්ආන් වැකියෙහි මනාව පැහැ දිලි වේ. *මම ජින් සමූහයද මිනිස් සමූහයද මා නැම දුම් කරන් නට මිස මැව්වේ නැත. මා ඔවුන්ගෙන් (පැවැත්මට) ජීවිකාවක් නොඉල්ලමි. ආහාර දෙන ලෙසද මම ඔවුන් ගෙන් නොඉල්ලමි. ඇත්තෙන්ම (සියළු නිර්මාණයන හට පැවැත්මට) ජීවිකාව දෙන්නේ අල්ලාහ්මය. ඔහු තිරවත් බල හිමිය.* (51 : 56 - 58)

තවද සර්වබල අල්ලාහ් තම වදනින්ම පවසන බව මුහම්මද් තුමාගේ හදීස් සංකල්පයක සනිටුහන් වන කියමනක් පැහැදිලිව මෙසේ සඳහන් වෙයි. 'මගේ අනවැසියනි, හුදෙක ලාබේ පසුවන මම මගේ පාලුව මගහරවා ගනු අරභයා මා සෙල්ලමට ඔබලා නිර්මාණය කළේ නැත. එසේ නොවන්නට මගේ අන වැසියන් ප්‍රගුණ කර ගැනීම පිණිසද මම මිනිස් සමාජය නිර්මාණය නොකළෙමි. මට මා විසින් කර ගැනීමට නොහැකි වැඩ කටයුතු කරගැනීමටද ඔබලාගේ පිටිවහල ලබා ගැනීමටයද මම ඔබලා නිර්මාණය නොකළෙමි. එසේත් නොවන්නට ඔබලාගෙන් හොඳක්, පිනක් ලබා ගැනීමට හෝ මට අත්විය හැකි දුක්කරදර සහ බාධක ඉවත්කර ගැනීමට

හෝ මම ඔබලා නිර්මාණය නොකළෙමි. ඒ නිසා මා පමණක් මෙනෙහි භාවනා කර, මගේ අණපනත්වලට පමණක් කීකරු වී, යටත් වී දිවා රෑ සුවිසුද්ධ කරමින් මා පමණක් වන්දනා මාන කරමින් සිටිය යුතුය යන එකම පරම ඉලක්කය උදෙසා මම ඔබලා නිර්මාණය කළෙමි'.

තවද මිහිපිට නිර්මාණය කර ඇති නිර්මාණ ගැන විවෘතව ගණනය කර බලන කෙනෙකු ඔහු දකින සියලු මැවීම් එක්තරා ප්‍රමාණයක අනුන්ට සේවය කරන, අනුන්ට උදව් වන ස්වභාවය මත නිර්මාණය වී ඇති අන්දම වටහා ගන්නේය. හඟින්නේය. එසේම මැවීම්වල යථාර්ථය අපද විශ්ලේෂණය කර වටහා ගැනීමට උත්සුක වන කළ එහි හස්තසාර හරය මනා ලෙස වටහා ගත හැකිය.

අහසෙන් ඇද හැලෙනා වැස්ස ගැන මදක් සිතා බලන්න. එසේ අහසෙන් කඩා හැලෙනා සියලු ජලය මිහිතලය උරා ගන්නේය. එය කරන කොට ගෙන නිස්සාර පොළොව සාර වත් වන්නේය. එසේ උරා ගන්නා ජලයෙන් මිහිකත පමණක් ප්‍රයෝජනය ලබා ගන්නවා නොවේ. එයින් එහි වැඩෙන ශාක සහ වෘක්ෂ ලතාදීන් ප්‍රයෝජන ලබන්නේය. මිහිකත උරා ගන්නා ජලයෙන් ප්‍රයෝජන ලබන ශාක සහ පත්‍ර අප්‍රමාණ සත්ත්වයන්ගේ, මිනිසුන්ගේ, අනෙකුත් ජීවීන්ගේ සාගින්න නිවන ආහාරය බවට පත් වන්නේය. ඒ සත්ත්වයන්ගෙන් බොහෝ දෙනෙකු මිනිසා තම පිට මත ඔසවා ගෙන ඔවුන් අතිමහත් පරිශ්‍රමයෙන් යන ස්ථාන කරා යන වාහන ලෙසද, ඔවුන්ගේ බර උසුලන ගැල් ලෙසද, කුලී හේවායන් ලෙසද ප්‍රයෝජන වන්නේය. ඔවුන්ගේ මාංශ මිනිසාගේ සහ අනෙකුත් සමහර ජීවීන්ගේ පෝෂ්‍යදායී ආහාර ලෙසද ඔවුන්ගේ අං සහ සම වැනි අනෙකුත් අවයවයන් අන් ආකාරයටද ප්‍රයෝජනය වන්නේය. මෙසේ සෑම දෙයක්ම ගණනය කර

බලද්දී, අවධානය කර බලද්දී මිහිපිට ඇති නිමැවුම්වල එකක් අනෙක් එකකට ප්‍රයෝජන වෙමින් සම්බන්ධිතව තිබෙන බව වැටහේ. කාරණය එසේ වෙද්දී මිනිසාගේ සම්භවයේ හේතුව, ඔහු කුමන හේතුවක් උදෙසා නිර්මාණය වීද යන්න ගැන මනාව වටහා ගැනීමේ සන්ධිස්ථානයකට සෑම මිනිසාම පත්ව ඇත.

මිනිසා මිහිපිට නිර්මාණය වූ මුඛ්‍ය හේතුව ඔහු තම හිමි ගැන මනාව වටහා ගෙන ඔහුගේ අනපනත් සහ ආඥාවන්, අනුමත කිරීම් සහ තහනම් කිරීම් ගැන අධ්‍යයනය කර වටහා ගෙන ඒවාට කීකරු වී, ඒ පරම ආදර්ශ නීතිවලට අනුගතව ජීවත් වීමටය යන යථාර්ථය මිනිසාගේ ශෝභමාන නිර්මාණය සහ සූකෂමව නිර්මාණය කරන ලද මහපොළොව සහ එහි ඇති දේද සාත්ෂාත් වෙමින් පවතී. මෙසා මහපොළොවේ නිමවුනු සියලු දේ මිනිසාගේ උවමනාව සහ පරිහරනය වෙනුවෙන් නිර්මාණය වී ඔහුට එහි ආධිපත්‍ය පවරා දී ඇති කළ, ඒ නිමැවුම් මිනිසාට යතා අන්දමින් තම සේවය ඉටු කරමින් යටත්ව පසුවන කළ, ඒ මිනිසා ඒ නිර්මාණයන් හට වහලෙකු ලෙස, ඒවාට සේවය කරන කෙනෙකු ලෙස හෝ ඒවා පාමුල වැඳවැටී ගරුබුහුමන් කරන කෙනෙකු ලෙස හෝ වන්නේ කෙසේද?

මිනිසාගේ මිහිපිට උවමනාව පිණිස අල්ලාහ් දෙවිඳු විසින් නිර්මාණය කළ නිමැවුම්වලට මිනිසා වහලෙකු වූ හෙයින්ද, ඒවාට ගරුබුහුමන් කිරීමට ඉදිරිපත්වූ හෙයින්ද තමාට සේවය කිරීමට තමාගේ උවමනාව පිණිස නිර්මාණය වූ ඉර, සඳ, සත්ත්වයන්,තාරකා, ගංගා, ඇල දොල, වෘකෂ ලතාදීන් සහ අනෙකුත් විවිධ නිර්මාණයන් වෙනුවෙන් වන්දනාමාන ගරුබුහුමන් කරන්නට පෙළ ගැසී ඇති බව නොකිව මනාය. යථාර්ථ නියමය සහ පැවරුම අනුකූලව මිනිසා කුමන හේතුව

ක් අරභයා නිර්මාණය කරන ලද්දේද යන හේතුව කෙරෙහිද විවෘතව චින්තනය යොමු කරද්දී, මිනිසා වෙනත් මිනිසෙකු හෝ ඉර, සඳ, තාරකා හෝ ගස්, ගල්, ගංගා හෝ සත්ත්ව යන් සහ වෘක්ෂයන් හෝ වැඳ පුදා ගැනීමෙන් වළකී, තම උත්තම දෙවිඳු වටහාගෙන ඔහුගේ අනපනත්වලට පමණක් කීකරු වී පමණක් පිරිසිදු චේතනාවෙන් වන්දනාමාන කිරීමට, ගරුබුහුමන් කිරීමට, කටයුතු කිරීමට නිර්මාණය කර ඇති බව සුපැහැදිලිය. එසේම ප්‍රතික්ෂේප කිරීම්, යථාර්ථය පිටුදැකීම්, පිළිම වන්දනාව සහ අදැමිටු ක්‍රියාවන් සාතාන්ගේ නොමඳ උත්සාහයෙන් සහ ඔහුගේ ප්‍රයෝගාකාර වංචාවෙන් ඇති වූ බව ප්‍රතික්ෂේප කළ නොහැකි සත්‍යයකි.

වන්දනාමානයට සුදුස්සා අල්ලාහ් පමණකි

අති උත්තම අල්ලාහ් දෙවිඳු මුල්ම මිනිසා නිර්මාණය කළ දිනයේම 'මිනිසුනේ, ඔබගේ හිමි වන අල්ලාහ් පමණක් වදින්න, ඔහු හැර වදින්නට ගරුබුහුමන් කිරීමට අන් දෙවියෙක් ඔබට නැත' යන අදහස ඔහුට උගන්වා, එයට අදාල ආඥාව න්ද නීතිරීතින්ද නියම කළේය. එසේම ඒවා වචනයේ පරිසමාප්ත අන්දමින් ඉටු කිරීමේ පැහැදැලි චින්තනයක්ද ඔහුගේ හදමනස තුල ජනිත කර ඇති බවද සාක්ෂාත්ය. විවෘත විශ්වය තුල පවතින විශ්මිත සාධක ඒ ආඥාවේ, තියදියේ ක්‍රියාකාරම් මිනිසා වචනයේ මුළුතින්ම ඉටුකළ යුතු බවට පවතී. තම වහලා කීකරු වී කටයුතු කළ යුතු එවන් වැදගත් ගිවිසුමක් සහ ආඥාවක් ඔහු හා කර ගෙන ඇති බව පරම පිවිතුරු අල්ලාහ් දෙවිඳුම ශුද්ධවූ අල්කුර්ආනය තුලින් මෙසේ තිරසාරව පවසා සිටී. *ආදම්ගේ දරුවනි, ඔබලා (මා හැර) ෂෛයිතාන්ට වන්දනාමාන නොකරන්න යනුවෙන් මම ඔබලාට (ප්‍රතිඥා වී) අණ නුදුන්නෙම්ද? ඇත්තෙන්ම*

*ඔහු ඔබට ප්‍රකට සතුරෙකි. ඔබලා මා පමණක් වන්දනාමාන කරව. (ඔබලාට හිමි) ඍජුමග එය වේ.* (36 : 60- 61)

තවද අල්ලාහ් දෙවිඳු, පිරිසිදු චේතනාවෙන් තමා පමණක් වන්දනාමාන කරන ලෙසත් ඔහු හැර වන්දනාමාන කරන දැයින් සියළු ව්‍යාජ දැයින් ඉවත්වන ලෙසත් තම අතවැසියා හා කර ගෙන ඇති නොගිලිහෙන ඒ ගිවිසුම ගැන අල්ලාහ් දෙවිඳු පරිශුද්ධවූ අල්කුර්ආනයේ තවත් තැනකද මෙසේ විස්තර කරයි: *ඔබගේ දෙවිඳු ආදම්ගේ දරුවන්ගෙන්, ඔවුන්ගේ පෘෂ්ටයෙන් (මිහිපිට) ඔවුන්ගේ සංහතිය බිහිකර ඔවුන් තමන් කෙරෙහිම සාක්ෂි කරුවන් කර 'මම ඔබගේ හිමි නොවෙම්ද?' යනුවෙන් විමසූ කළ 'එසේය, අපි සාක්ෂි දරන් නෙමු' යි කී අයුරු සිහි කරව. මන්දයත් (ඒ සාක්ෂි දැරීම) අමතක කර පුනරුත්ථාන දිනයේ අප නොසැලකිල්ලෙන් පසුවීමුයනුවෙන් ඔබගෙන් කිසිවෙක් නොකියන ලෙසද (අප ඔබලා සාක්ෂි කරුවන් කළෙමු). නොවන්නට මිත්‍යාව අනුග මනය කළවුන් 'පෙර සමානයන් තැබුවෝ අපගේ පියවරුන්ය. පසුව අපි ඔවුන්ගෙන් පැවත එන්නන් වෙමු. ඒ නොමග ගියවුන්ගේ ක්‍රියාව නිසා ඔබ අප විනාශ කරන්නෙහිද? යි ඔබලා (දුර්මගට වී කුතර්කව එසේ) නොකියනු පිණිසත් එසේ (ඔබලා ස්ථිර) සාක්ෂි කරුවන් කළෙමු.* (7 : 172 -173)

පෙර සඳහන් අල්කුර්ආන් වාක්‍ය කීපය අනුව, මුල් වරටම අල්ලාහ් දෙවිඳු තම අතවැසියා සමග කර ගත් ඒ ගිවිසුම මිනිසාට ඉඳුරාම අමතක විය. නොවන්නට උවමනාවෙන්ම පිටු දැක්කා විය හැකිය. ඔහු තම හද මනසට වහල්වී සපුරාම එයට පටහැනිව ක්‍රියා කළේය. එහෙයින් වක්තෘ වරුන්, දහම් සහ අනෙකුත් දිවප්‍රසාදී වරුන් පහළ කිරීමට මුඛ්‍ය හේතුව නොදැනුවත්ව, වැරදීමකින් සත්‍ය හිමි වන්දනාමාන කිරීමෙන් වැළකී පිළිම සහ අනෙකුත් ව්‍යාජ ඒවා වන්දනාමාන කළ

අය එයින් සපුරාම ඉවත් කර, කිසිදු සාධකයකින් තොරව අන්ධානුකරනයෙන් පිළිපැද ගෙන ආ තම මුතුන් මිත්තන් ගේ පැවැතුම් සහ වන්දනාමානයෙන් ඉවත්කර යහමග පෙන්වීම යන්න සක්සුදක් සේ පැහැදිලිය.

මිනිසාට යහමග පෙන්වනු වස් ආ සියලු වක්තෘ වරයෙක්ම එකම එක කරුණක්, පණිවුඩයක් පතුරුවාලීම සාක්ෂාත් කරගෙන පත්වූ බව අල්ලාහ් දෙවිඳු අල්කුර්ආනයේ පැහැ දිලිව විස්තර කරයි. *මගේ ජනතාවනි, අල්ලාහ් පමණක් නමදිව්. ඔබට ඔහු හැර වෙන දෙවියෙක් නැත.* (7 : 59)

ඒ දිව්වදන පවසන අන්දමින් පැමිණි නූහ්, සාලිහ්, ලූත් සහ ෂුඅයිබ්, වැනි වක්තෘ වරුන් තම සමාජ වැසියන් හටද, එසේම ඒකේශ්වර වාදය ප්‍රතිකෙෂ්ප කරමින් සිටි අනෙකුත් සමාජයන් වෙත පිටත් කළ වක්තෘ වරුන්ද, ඒ ඒ සමාජ වැසියන් අති උත්තම අල්ලාහ්ගේ දෙවිඳුගේ සුගම කෙරෙහි අමතන්නට වූහ. ඒ ගැන පැහැදිලිව අල්ලාහ් අල්කුර්ආනය තුලින් මෙසේ විස්තර කරයි: '*අල්ලාහ් පමණක් නැමදිව්. නාසූත් නම් (අල්ලාහ් හැර වන්දනාමාන කරන සියළු දෑ) අත් හරිව්යයෑ (ප්‍රකාශ කරමින්) අප එක් එක් ජනතාව කට වක්තෘ වරයෙකු එව්වෙමු.* (16 : 36)

'*මා හැර (ඔබට වැඳීමට) දෙවියෙක් නැත. එහෙයින් මා පමණක් නමදිව්' යනුවෙන් ඔහුට වහී නම් සුර පණිවුඩ පහළ කොට මිස ඔබට පෙර කිසිදු වක්තෘ වරයෙකු නොඑව්වෙමු.* (21 : 25)

මිනිස් සමාජය එකම සමාජයකි. ඒ මිනිස් සමාජය බිහි වූයේ එකම මිනිසාගෙනි. එරසේම ඒ මිනිස් සමාජයට ඇත් තේද එකමඑක දෙවිඳු කෙනෙකි. ඒ යථාර්ථ කරුණ ගැන අල්ලාහ් දෙවිඳු අල්කුර්ආනය තුලින් මෙසේ විස්තර කරයි.

*'සැබැවින්ම ඔබගේ සමාජ (කිසිදු වෙනස්කමක් නැති) එකම සමාජය වේ. තවද ඔබගේ දෙවියා මාය. එහෙයින් මා පමණක් නමදිව්.*(21 : 92)

මිනිසා සිතට වහල් නොවී අල්ලාහ් දෙවිඳු විසින් අනුමත වූ පිරිසිදු ආහාර පමණක් අනුභව කළ යුතුය. එසේම ඒ එකම පරිශුද්ධවූ දෙවිඳු පමණක් වන්දනාමාන කළ යුතුය යන්න අල්කුර්ආනයේ තවත් තැනක අල්ලාහ් දෙවිඳුම මෙසේ පවසයි: *වක්තෘ තුමනි, හොඳ දැයින් පමණක් ඔබලා අනුභව කරවූ. සාලිහ් වූ යහකම්ද කරව. ඇත්තෙන්ම ඔබ කරන දෙය මම දනිමි. තවද සැබැවින්ම ඔබගේ (මුළු සත් මාර්ග) සමාජය එකම සමාජය වේ. ඔබගේ දෙවියා මාය. එහෙයින් මට බියබැතියත් වව.* (23 : 51 -52)

මිහිපිට පත්වූ මිනිසා කවදා හෝ මිහිපිටෙන් සමු ගෙන මිහිදන් වන්නේය. එහෙයින් ඒ අවසන් මොහොත පැමිණෙන තෙක් ඔහු ඒ පරම පිවිතුරු අල්ලාහ් දෙවිඳුට වන්දනාමාන කළ යුතුය. ඒ මැයෙන්ම අල්ලාහ් දෙවිඳු මිනිසාගේ සුභ විහරණය සහ පැවැත්ම උදෙසා ඔහුට යහමග පෙන්වනු වස් අවසාන වක්තෘ වරයා ලෙස මුහම්මද් තුමා පත්කර එතුමාට මෙන්ම පොදුවේ මෙසේ අනුභාව සම්පන්න අණක් පණවයි : *'නියතය (නම් මරණය) ඔබට පැමිණෙන තෙක් ඔබ හිමි නමදිව්'.* (15 : 99)

එසේම ඒකේශ්වර වාදය සහ අල්ලාහ් දෙවිඳුගේ ආඥාවන් පිටුදකිමින් කටයුතු කළ සමාජයක් අවසාන දිනයේ දකින ගොරතර වේදනා දැක දුකට පත්ව තම ඉරණම ගැන සිතා දුක්මුසුව පවසන බව අල්ලාහ් දෙවිඳු අල්කුර්ආනයේ මෙසේ පවසයි : *'අපට නියතය (නම් අවසන් මරණය) පැමිණෙන තෙක් අප ඒ (සත්‍ය) විනිශ්චය දිනය ප්‍රතික්ෂේප කරමින් හුන්නෙමු'.* (74 : 46-47)

ඉහත සඳහන් කළ අල්ලාහ් දෙව්දුගේ නිදර්ශනාත්මක දිවි වදන් අනුව මිනිසා උපන්දා පටන් තම හිමිගේ ආඥාවන් හට ඉනසිතින් කීකරු වී ඔහුට පමණක් වන්දනාමාන කිරීමට අනපනවා ඇති බව සක්සුදක් සේ පැහැදිලිය. එසේ නොවන්නට තමා උසස් තත්ත්වයක සිටී, අල්ලාහ් දෙව්දුට සමීපව සිටී යනුවෙන් පවසා ගති මින් ඒ අල්ලාහ් දෙව්දු අණ පනත් පිළිගෙන වන්දනාමාන කිරීමෙන් වැලකී ශ්‍රධාවන්ත කම නැතිභංගස්ථාන කර ගනිමින් සිටීමට කිසිවෙකුට කිසිදු අවස්ථාවක් නැත. මිහිපිට උපන් සියලු දනන් උපන් දා සිට මරණය දක්වා තම හිමි අණ කළ අන්දමින් ඔහුට පමණක් කීකරු වී අන්දමින්ම වන්දනාමාන කළයුතු බව ඒ දෙව්දු විසින්ම විධිවත්ව පවරා ඇත. එසේම අල්ලාහ් දෙව්දු හැර මිහිපිට උපන් කිසිවෙකුට දේවත්වයෙහි කිසිදු අවස්ථාවක් නැති බවත් වන්දාමා නයට නුසුදු බවත්, එසේ තමාට වන්දනාමාන කිරීමට අණ කිරීමට කිසිදු වක්තෘ වරයෙකුට හෝ ශ්‍රද්ධාවන්ත පුද්ගලයෙකුට අවසරයක් දී නැති බවත් අල්කුර්ආනය පැහැදිලිව පවසා සිටී :*(මර්යම්ගේ පුත් ඊසා) මසීහ් අල්ලාහ්ට වහළෙකු වීමට අකමැති නොවන්නේය. තවද (අල්ලාහ් වෙත) ළංවූ විශේෂ සුරදූතයන්ද අකමැති නොවන් නේය. (වහලෙකු වී කීකරු වී අල්ලාහ්ට) ඇදහීම නින්දාවක් යැයි සිතා උඩඟු වන්නේ කවරෙක්ද ඔවුන් සියලු දෙනාම ඔහු (පරමාන්ත දිනයේ) තමා වෙත එක්රැස් කරන්නේය. නමුදු විශ්වාස කර යහකම් කරන්නේ කවරෙක්ද ඔහු ඔවුන්ගේ සුවිපාකය සපුරාම දෙන්නේය. තවද, ඔහුගේ අනුග්‍රහයෙන් ඔවුනට වැඩියෙන්ද දෙන්නේය. ඔහුට කීකරු වීමට අකැමැති වී උඩඟු වන්නේ කවරෙක්ද ඔවුනට වේදනීය අඬුවමෙන් අඬුවම් කරන්නේය. තවද අල්ලාහ් හැර ඔවුනට ආරක්ෂක යෙකුද උදව් කාරයෙකුද නොලබන්නේය.* (4 : 172-173)

එසේම මිනිසා තුල මනා දැනුමක් නැති පරමාන්ත දිනයේ අනිවාර්යයෙන්ම සිදුවිය හැකි මහා සිදුවීමක් ගැන අල්ලාහ් දෙවිදු මිනිසාට මෙසේ විස්තර කරයි : 'පරමාන්ත දිනයේ අවසාන තීන්දු දිනයේ අල්ලාහ් දෙවිදු මර්යම්ගේ පුත්‍ර වක්තෘ ඊසා තුමා අමතා එතුමාගේ සමාජ වැසියන් එතුමා අල්ලාහ්ගේ ස්ථානයට පත් කර මහෝත්තම කර වන්දනාමාන කිරීමට හේතු වූයේ එතුමාදැයි විමසනු ලබනු ඇත. එයට එතුමා එසේ කටයුතු කිරීමට තමා කිසිසේත් හේතු වූයේ නැත යනුවෙන් ශාන්තදාන්තව පිළිවදන් දෙනු ඇත. ඒ සිද්ධිය පැහැදිලි කරමින් ශුද්ධවූ අල්කුර්ආනයම ස්ථිරව මෙසේ පවසා සිටී : '*(විනිශ්චය දිනයේ) මර්යම්ගේ පුත්‍ර ඊසා, (වන්දනා මානයට) අල්ලාහ් හැර මාද මගේ මවද දෙවිවරු දෙදෙනෙකු කර ගනිව්' යයි ඔබ මිනිසුන්ට කීවේද? යි අල්ලාහ් විමසන කළ ඔහු 'ඔබ ඉතා පරිශුද්ධය. මට නොඅයත් දෙයක් මම කිසිසේත් නොකියමි. මා එසේ යමක් කියා ඇත්නම් සැබැවින්ම ඔබ එය දනී. මගේ මනස තුල ඇති දේ ඔබ දනී. නමුදු ඔබ සිත්තුල වන දේ මම කිසිසේත් නොදනිමි (එවන් ශක්තියක්ද මට නැත). සැබැවින්ම ගුප්ත දෑ ගැන මනාව දන්නේ ඔබ පමණි. ඔබ මට අණ කළ පරිදි මම (මවුන් අමතා) ඔබගේද මගේද හිමි වූ අල්ලාහ් පමණක් නමදිව්' මිස අන් කිසිවක් මවුන්ට නොකීවෙමි. තවද මා (මිහිපිට) මවුන් සමග සිටි කාලය තුල මවුන්ට සාක්ෂිව සිටියෙමි. ඔබ මා අත්පත් කරගත් අවස්ථාවේ මවුන් ගැන (නිසි) නිරීක්ෂණය කරන්නෙකු ලෙස සිටියේ ඔබමය. සියලූ දැය කෙරෙහිම සාක්ෂියක් වශයෙන් සිටින්නේය (යනුවෙන් ඊසා තුමා පවසන්නේය).* (5 : 116 -117)

තවද ඊසා තුමා ගැනවූ සම්භවයක් ගැන බයිබලයේ පවසන සිදුවීමක් මෙසේ විස්තර වෙයි : වරෙක ෂයිතාන් වක්තෘ මර්යම්

ගේ පුත් ර්සා තුමා පරීක්ෂණයට භාජනය කිරීමේ අටියෙන් එතුමා උස් කඳු ආශ්‍රිත ප්‍රදේශයකට කැඳවා ගෙන ගොස් මිහිපිට ඇති සියලු දෑ සහ එහි ඇති වැදගත්කමද පැහැදිලි කළේය. පසුව 'ඔබ මට වරක් පමණක් ශාෂ්ඨාංග කරන්නේ නම් මේවා සියල්ල ඔබට යටත්කර දෙමියි ප්‍රතිඥා විය. එය ඇසූ ර්සා තුමා උරන වී 'එම්බා ෂයිතාන්, වහා මෙතැනින් පිට වව. ශාෂ්ඨාංග කළ යුත්තේ නිර්මාතෘ වරයාට පමණි. වන්දනාමාන කළ යුත්තේද ඔහුට පමණි යයි ඒ අල්ලාහ් දෙව්ඳුම අප සියලු දෙනාට අනපනවා ඇත' යනුවෙන් පවසා ෂයිතාන් එළවා දැම්මේය.

එසේම මිහිපිට එලි දුටු දහම් සියල්ල පරමාධිපත්‍යයාගේ අනපරිද් වක්තෘවරුන් ප්‍රචාරය කල අන්දමින් අල්ලාහ්ට පමණක් යටත්වී ඔහුට පමණක් වන්දනාමාන කිරීම මිනිස් නිර්මාණයේ වැදගත් ඉලක්කය බව මෙතෙක් අප විස්තර කළ කරුණුවලින් සක්සුදක්සේ පැහැදිලි වෙයි. එහෙයින් මේ කරුණ ස්ථිරසාරව වටහා ගෙන ඒ අර්ථානුසාරයෙන්ම කටයුතු කිරීමට සෑම මුස්ලිම් වරයෙකුම බැඳී සිටින බව නොකිව මනාය.

ඉස්ලාමීය වන්දනාමානයේ ස්ථාවරය

ඉබාදා යන අරාබි වදනට හෙල බසෙන් යටත්පහත් වී අනපනත් වචනයේ පරිසමාප්ත අන්දමින්ම පිළිගෙන වන්ද නාමාන කිරීම යනුවෙන් අර්ථවත් කළ හැකිය. එසේම අබ්ද් යන අරාබි වචනයටද වහලා යන තේරුම පිළිඹිමු වේ. ඉබාදා යන වචනය අබ්ද් යන වචනයෙන් බිඳී ආ වචනයකි. තවද වන්දනාමාන කිරීම, යටත්වීම, කීකරු වීම, අණපනත් පිළිපැදීම යන සියලු වදන්ද ඒ මැයෙන්ම ඒ හා සමාන අරුථ ගෙන දෙන්නේය.

යමෙක්, පර මෝත්තම අල්ලාහ් දෙවිඳු වෙනුවෙන් කළයුතු කටයුතු ගරුබුහුමන් තවත් පිටස්තරයෙක් උත්තතියට පත් කර පහත් අන්දමින් ඔහු වෙනුවෙන් කරන විට ඔහු, ඔහුට ගරුබුහුමන් කරන්නෙක් වන්ද ාමාන කරන්නෙක් යනුවෙන් අප සමාජය තුල සාමාන්‍යයෙන් අර්ථකථනය කිරීම අප බොහෝ විට අසා ඇත්තමු. නමුදු යමෙකු අල්ලාහ් දෙවිඳුගේ ආඥා අනපනත්වලට කීකරුවී කටයුතු කිරීමේදී ඒවා සියල්ල පරම පිවිතුරු අල්ලාහ් දෙවිඳු වෙනුවෙන් වූ වන්දනාමාන ලෙස වන්නේය. එහෙයින් අප කරන ඕනෑම වන්දනාමානයක් වුවද ඒවා කළ යුතු සුදුස්සාට පමණක් කළ යුතුය. ඒ හැර තවත් කෙනෙකු අල්ලාහ් දෙවිඳුගේ ස්ථානයෙහිලා සළකා ඔහු වෙනුවෙන් වන්දනාමාන කිරීම පඬුරු වැනි දේ පුද කිරීම අල්ලාහ් දෙවිඳු අනුමත කරන්නේ නැත. එසේ කිරීම අල්ලාහ් දෙවිඳුට ආදේශ කිරීම නම් විශාල කිසිවිටෙක සමා නොදෙන පවක් ලෙස සැළකෙන්නේය. මේනයින් බලන කළ අපගේ සියලු වන්දනාමානයන් හට එකම සුදුස්සා අපට සවනය, දෘෂ්ටිය, පීවය, ජීවිතය සහ චින්තනා ශක්තිය වැනි පද්ධතින් ලබා දුන් පරම පිවිතුරු අල්ලාහ් දෙවිඳු බව සක්සුක්සේ පැහැදිලිය.

තවද වන්දනාමානය යන අරාබි වදනට මූලික තේරුම වන්නේ යටහත්පහත් වීම, කීකරු වීම යන්න වේ යනු වෙන් විශද ඉස්ලාමීය විද්වතෙකු වන ඉබ්නු තෛමියා තුමා පවසයි. නමුදු අප අපගේ ඉලක්කය වචනයේ අර්ථානුසාර යෙන්ම සාක්ෂාත් කර ගනු වස් සත්‍ය පරම පිවිතුරු දෙවිඳු පමණක් වන්දනාමාන කරන කළ හුදෙක් මුළු හදමනසින් නිහතමානීව ඒ දෙවිඳුට ප්‍රේම කළ යුතු අතර, ඒ දෙවිඳුගේ සියලු අනපනත් සහ ආඥාවන් හට කීකරුවී කටයුතු කිරී මට බැඳී සිටින්නෙමු. එහෙයින් කෙනෙකු මුළුමනින්ම

අල්ලාහ්ට කීකරුවී කටයුතු කරයි යන්න අර්ථවත් වන කළ ඔහු අල්ලාහ් දෙවිඳුට අති ඉහළ අන්දමින් ප්‍රේම කරන්නේය යන්නද සාක්ෂාත් වේ. තවද යමෙකු අතිමහත් අන්දමින් ප්‍රේමය කරන්නේ නම්, ඒ ප්‍රේමය හා ඔහුට කීකරු වන්නේ නම්, ඒ ප්‍රේමය හා කීකරු වීම සමග ඔහුගේ අනපනත් සම්පූර්ණයෙන්ම ඉටු කරන්නේ නම් ඔහුගේ හෙතෙම අල්ලාහ් දෙවිඳුට සපුරාම කීකරුවී කටයුතු කරන වහලෙකු වීම වේ යනුවෙන් අර්ථවත් කළ හැකිය.

තවද යමෙකු මුළුමනින්ම අල්ලාහ් දෙවිඳුට ප්‍රේම කිරීම සහ ඔහුගේ අනපනත් සහ ආඥාවන් හට සම්පූර්ණයෙන්ම කීකරුවී කටයුතු කිරීමද අල්ලාහ් දෙවිඳුට පමණක් විනා අන් කිසිවෙකුට හෝ කිසිවකට හෝ නොවිය යුතුය. වෙනුවට අල්ලාහ් හැර විශ්වයේ විසිරී පවතින ඔහුගේ මැවීම්වලට එනම් අල්ලාහ් දෙවිඳු හැර අන් ඒවාට තත්ත්වයෙන් උසස් කර දෙවියෙකු ලෙස තකා ප්‍රේම කිරීම සහ සම්භාවණ යටපත් කිරීම ඉස්ලාම් කිසිසේත් අනුමත නොකරන අති පහත් ක්‍රියාවක්, පාපයක් බව ඉස්ලාම් දහම තරයේ කියා සිටී. ඒ ගැන අල්ලාහ් දෙවිඳු ශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි : (නබි තුමනි) *'ඔබගේ පියවරුන්ද, ඔබගේ පුත්‍රයින්ද, ඔබගේ සහෝදරයන්ද, ඔබගේ භාර්යාවන්ද, ඔබගේ නෑයන්ද ඔබ උපයා ගත් සම්පත්ද විටෙක අලාභ වේ යයි ඔබ බියවන (ඔබගේ) වෙළඳාමද ඔබ ප්‍රියව වාසය කරන නිවාසද-අල්ලාහ්ටද ඔහුගේ වක්තෘ වරයාටද අල්ලාහ්ගේ මාවතෙහි සටන් කර පරිශ්‍රම වීමට වඩා ඔබට ප්‍රිය මනාප වේ නම් අල්ලාහ් ඔහුගේ (වේදනා සහිත දඬුවම නම්) විනිශ්චය පමුණුවන තුරු බලාපොරොත්තුවෙන් හිඳිවුයි කියව්.* (9 : 24)

ඉහත සඳහන් වූ පරිශුද්ධ වූ අල්කුර්ආනයේ වදන් පෙළ අනුව ඉස්ලාම් දහම තුල වන්දනාමානයට දී ඇති අර්ථකථනයේ බැරෑරුම ගැන වටහා ගැනීමේදී දහම තම ළමයි සේසත් සහ අනෙකුත් ප්‍රිය වන ලෞකික දේවලට වඩා අල්ලාහ් දෙවිඳු වෙත ළංවිය යුතු බව සක්සුදක්සේ පැහැදිලි වේ. ඉස්ලාම් දහම පවසන වන්දනාමාන පිළිවෙත කරුණු දෙකක් මත සංස්ථාපිථ වන බව වටහා ගත යුතුව ඇත.

දයාන්විත අල්ලාහ් දෙවිඳු තම පමාධිපත්‍ය විධානය තුලින් දහම ලෙස කුමක් ප්‍රසිද්ධ කර ඇත්දෝ ඒවා ඔහුගේ ආඥාවන්, අනුමත කිරීම්, තහනම් කිරීම්, හලාල් සහ හරාම් වැනි නීතියට සපුරාම ඇතුල්වන ඕනෑම එකක් වූවද වක්තෘවරුන් ඒ ආඥාවන් මත ජනයන් අමතා කටයුතු කර ඇත්නම් අපද ඒවා වචනයේ පරිසමාප්ත අත්දමින් පිළිපැදිය යුතුය. මෙසේ ඒ පරමාධිපත්‍ය අනපනත්වලට මුළුමනින්ම කීකරු වී කටයුතු කිරීම අල්ලහ් දෙවිඳුට පරිසමාප්තව කීකරු වී කටයුතු කිරීම යනුවෙන් අර්ථවත් වේ. නමුදු පරම අල්ලාහ් දෙවිඳුගේ ආඥාවන් හට කීකරු වී කටයුතු කිරීම ප්‍රතික්ෂේප කරන්නේ කවරෙක්ද, නොවන්නට අල්ලාහ්ගේ ආඥාවන් පිළිගැනීමෙන් උඩඟු ලෙස අකීකරු වන්නේ කවරෙක්ද, නොවන්නට උවමනා වෙන්ම ඔහුගේ ආඥාවන් සහ අනපනත් පිටු දකින්නේ කවරෙක්ද ඔවුන් අල්ලාහ් දෙවිඳු අහස පොළොව සහ ඒවා අතර වූ ඒවා මවා පාලනය කරන්නා, පෝෂණය කරන්නා, පන දෙන්නා, පන නසන්නා යනුවෙන් ඔහුගේ දේවත්වයේ ගුණාංක පිළි ගත්තද ඔවුන් අල්ලාහ්ගේ කීකරු අනවැසියන් ලෙස හෝ අල්ලාහ් පිළිගෙන වන්දනාමාන කරන කීකරු වහලෙක් ලෙස හෝ පිළිගත නොහැකිය.

මන්දයත් මුහම්මද් තුමාගේ සමයේ එවකට අරාබි කරයේ විසූ මිසදිටුවන් සහ ආදේශ කරන්නන් පවා අල්ලාහ්ගේ කේවලත්වය, විශ්වය මවා පාලනය කරන්නේ ඔහුය, අහ සෙන් සහ පොළොවෙන් සියලු මැවීම්වලට පෝෂණය කරන් නේ ඒ අල්ලාහ් දෙවිඳු විසින්ය වැනි ඉස්ලාම් දහමේ ප්‍රති පත්ති කීපයක්ම ඒ සත්‍ය ආගමික දැහැනට සමාධිගතව පිළිගත්තද පරම පිවිතුරු අල්ලාහ් දෙවිඳුගේ ආඥාවන් සහ අණපනත්වලට කීකරු වී ව්‍යාජ දෙවිවරු ඇදහීමෙන් ඉවත් වී ඔහුට පමණක් වන්දනාමාන කිරීම ප්‍රතික්ෂේප කළ හෙයින් ඔවුන් අල්ලාහ්ගේ ස්ථිර විශ්වාස වන්තයින් ලෙස හෝ අල්ලාහ් දෙවිඳුට කීකරුවූ අතවැසියන් ලෙස හෝ නොවන බව අල්කුර් ආනය පැහැදිලිව පවසා සිටී. මන්දයත් යමෙකු අහස පොළොව සහ ඒවා අතර වූ ඒවා මවා පාලනය කර පෝෂණය කරන්නා අල්ලාහ් දෙවිඳු යනුවෙන් ස්ථිරසාරව පිළිගැනීමෙන් පමණක් හෝ තමාට ඇති වන්නාවූ දුක්ඛිත සහ කර්කශ අවස්ථාවන්හී පමණක් ඒ අල්ලාහ් දෙවිඳු වෙත යටහත්පහත්ව හැරී ඔහුගෙන් උදව් පැතීමෙන් පමණක් හෝ ඒවා සත්‍ය බව අවිවාදිතව පිළිගැනීමෙන් පමණක් හෝ යමෙකු අල්ලාහ් ගේ සත්‍ය විශ්වාස වන්තයෙකු ලෙස විය නොහැකිය. අල්ලාහ් දෙවිඳු දහම ලෙස පිළි පැදීමට පවසන්නාවූ අනපනත්, ආඥා, අනුමත කිරීම්, තහනම් කිරීම් සහ නීතිරීති වැනි සියල්ල පිළි ගෙන අන්දමින් පිළිපැදීමෙන් වීනා හුදෙක් වචනයෙන් පමණක් අල්ලාහ් දෙවිඳු පිළි ගැනීමෙන් පමණක් නියම විශ්වාස වන්තයෙකු විය නොහැකිය. මන්ද යත් අල්ලාහ් දෙවිඳුගේ ආඥාවන් සහ අණපනත්වලට ඉඳුරාම කීකරු වන්නා සියළු කටයුතු ඒ ප්‍රතිඥාව අනුවම ක්‍රියාකළ යුතුව ඇත යන්න පැහැදිළිය. අල්ලාහ්ගේ සත්‍ය අතවැසියෙකු තම යුතුකම සහ තමා වෙත පවරා ඇති වගකීම කෙසේ

ක්‍රියාවට නගනවාද යන්න ඔහු විසින්ම පවසන අයුරු සහ තම අභිමතය ඉදිරිපත් කරන විලස ගැන අල්ලාහ් දෙවිඳුට පවසන අයුර අල්කුර්ආනයේ ලුහුඩින් මෙසේ පවසයි :

*අප ඔබම නමදිමු. ඔබගෙන්ම පිහිට පතමු.* (1 : 5)

තවද අල්ලාහ් දෙවිඳුට සම්පූර්ණයෙන්ම කීකරු වීම යනුවෙන් වූකලී එයින් අර්ථවත් වන තවත් කරුණක් වනුයේ අල්ලාහ් තම මැවීම් වෙතින් කිසිම පිටිවහලක් හෝ සහාය වීමක් හෝ ඔහුගේ කටයුතු නිම කරන වස් සහකරුවෙක් හෝ උවමනා නැති තනි කෙනෙකු බව පිළි ගන්නා අතර, අල්ලාහ් විසින් මවන ලද සුර දූතයන්, මිනිසුන්, ජින් සමූහය, තාරකාවන්, ඉර, සඳ, කඳුහෙල්, ගංගා ඇලදොළ, වැනි සියලු දැයම අල්ලාහ්ගේ වහලුන් සහ මැවීම් බවද, ඒවා සියල්ල ඒ පරම පිවිතුරු අල්ලාහ් දෙවිඳුගේ පාලනය සහ අනසක යටතේ ඔහුගේ නිරීක්ෂණය යටතේ පසුවන බවද පිළිගත යුතුය. විශ්වය තුළ ඇති සියල්ල අල්ලාහ් දෙවිඳුට කීකරු වී ඔහුට යටත්පහත්වී ඔහුගේ අනපනත් සහ ආඥාවන් පිළිගෙන ඔහුගේ මහෝත්තම භාවය පිළි ගනිමින් සිරස නමා ශාෂ්ඨාංග කරන්නේය. ඒ ගැන පරම පිවිතුරු අල්ලාහ් දෙවිඳුම පරිශුද්ධ වූ අල්කුර්ආනයේ මතු සඳහන් වදන් තුළින් මෙසේ පැහැසැරව පැහැදිලි කරයි :

*'අහස්හිද, මහපොළොවෙහි ඇති දැයද, ඒවායේ සෙව නැලිද, උදයද සවසද කැමැත්තෙන් හෝ නොකැමැත්තෙන් හෝ අල්ලාහ්ට යටහත්පහත් භාවයෙන් නැමදුම් කරන් නේය. නබි තුමනි, 'අහස්හිද පොළොවෙහිද හිමි කවරේදැයි ඔවුන්ගෙන් විමසනු මැනවි. ඒ අල්ලාහ් බව ඔබම පවසනු මැනවි. (එසේ වෙද්දී) ඔබලා ඔහු හැර (ව්‍යාජ දෙවිවරුන්) ආරක්ෂකයන් ලෙස ගන්නාද? (ඒ ව්‍යාජ දෙවිවරුන්) ඔවුන් තමනට පවා සැපතක් හෝ විපතක් කරන්නට නොහැකි*

*අයයි පවසනු මැනවි. තවද පවසව, අන්ධයා පෙනීම ඇත්තා හා සමාන වේද? නොඑසේනම් අන්ධකාරය සහ ආලෝකය එක හා සමාන වන්නේද? නොඑසේනම් ඔවුන් සමානකම් කරගෙන ඇති (ඒ ව්‍යාජ දෙවියන්) අල්ලාහ් නිර්මාණය කර ඇති සේ යමක් නිර්මාණය කළාද? (එසේ නම් මෙය අල්ලාහ්ගේ නිර්මාණයක්ද නොඑසේනම් ඔවුන්ගේ ආදේශි කයන්ගේ නිර්මාණයක්ද යනුවෙන් ඔවුනටම) සැක යක් ඇති විය හැකිය (එසේ නොව. එහෙයින්) අල්ලාහ් සියලූ දැයෙහි නිර්මාපකයාය. ඔහු කේවලය. සියලූ දේ කෙරෙහි බලහත් කාරීය (යනුවෙන්) පවසනු මැනවි.* (13 : 15 - 16)

තවද මිහිපිට ඇති මිනිසුන් ඇතුලුව මැවීම් සියල්ල තම අනසකට ගෙන මහේශාක්‍ය මහානුභාව සම්පන්නව පාලනය කරමින් පසුවන අල්ලාහ් දෙවිඳු පමණක් වන්ද නාමානයට පිළිගැනීමේ තවත් මූලික හරයක් නම් හොඳ සහ නරක, ජීවිතය සහ මරණය, මැවීම සහ විධානය කිරීම වැනි සකල කටයුතු ඔහු සතුව ඇති බවත් ඔහු යමක් මැවීමට මනාපය වන්නේ නම් සිත්සේ ‘වව්’ යන එකම වදනින්ම ඒවා මැවෙ න්නේය යනුවෙන්ද ස්ථිරසාරව පිළිගත යුතුය. තවද සියලූ අනපනත් සහ බලමහිම තමා සතු කරගෙන පසුවන අති ශක්තිමත් අල්ලාහ් දෙවිඳු අභියස තමා බෙලහීනයෙකු, අන වැසියෙකු ලෙසද සියල්ලෙහි ඥානය නිපුණ අන්දමින් තමා සතු කර ගෙන ඇති ඥානාන්විත ඔහුගේ ඉදිරියෙහි තමා මුග්ධයෙකු බවත් සියලූ සම්පත් තමා සතු කරගෙන ඇති ඔහුගේ ඉදිරිපිට තමා දිළින්දෙකු බවද පිළිගත් කළ සියලූ දැහි බලමහිමයක් ඇති නිත්‍ය ජීවයක් වන අල්ලාහ් දෙවිඳු අභියස තමා වහලෙකු බවත් වචනවලට පමණක් සීමා නොවී එහි භාවාර්ථයෙන්ම තමා ගැන ප්‍රසිද්ධ කළ යුතුය.

එහෙයින් මෙම කරුණු සහ විස්තර හේතුපාදක කර ගෙන මිනිසා තමාගේ නිර්මාතෘ වරයා වන පරම පිවිතුරු අල්ලාහ් දෙවිඳු ගැන මනාව වටහා ගන්නා විට, අප පෙර සඳහන් අයුරු අල්ලාහ් කෙරෙහි වූ විශ්වාස සහ හැඟීම් ප්‍රගුණ වී අල්ලාහ් කෙරෙහි වූ තමාගේ යුතුකම් ගැන මනා අවබෝධයක් තමා සතු කරගත් කෙනෙකු වන්නේය. එමතු නොව, තම සියලු කාර්යයන් අල්ලාහ් වෙත පවරා ඔහුගෙන් පමණක් උදව් උපකාර පතා, යටහත්පහත්ව, නිහතමානීව ඔහු වෙත දෑත් ඔසවා ඔහුගෙන්ම තම උවමනාවන් ඉල්ලා තමා දැනුවත්ව, නොදැනුවත්ව, වැරදීමකින් කළ සියලු පව්වු වෙනුවෙන් පශ්චාත්තාප වී ඔහුගෙන්ම පව් සමා අයදිය යුතු බව විශ්වාස කරන්නෙකු ලෙස පත්වන්නේය.

නමුදු මිනිසා සියලු බාධක මැඩගෙන තමා ගැන සහ තමාගේ නිර්මාතෘ වරයා ගැන මනාව වටහා ගැනීමට අපොහොසත් වන කළ, අප පෙර සඳහන් කළ අයුරු විශ්වාසය සහ හැඟීම් සපුරාම ඔහු කෙරෙන් ඉවත්වී ඔහු යටත්පහත් වී වන්දනාමාන කළයුතු දෙවිඳු වෙනුවට තම දුක්කම්කටොළු ඉවත් කර ගැනීම පිණිසද, තම උවමනාවන් පිණිසද, පව්සමාව අයැදීම පිණිසද, තම අභිමතයන් ඉටුකර ගැනීම පිණිසද, තම සිත්සේ ව්‍යාජ අසත්‍ය අතරමැදියෙකු තෝරා ගෙන ඔහුට වන්දනා මාන කරන්නට පටන් ගන්නේය. මෙසේ හෙතෙම වන්දනා මාන කිරීමට තෝරා ගෙන ඇති දෙවිඳු ස්ථිර සාරව විශ්වසයක් නැතිව හෝ වන්දනාමාන කළද ඔහු කළ ඒ වන්දනාමානයන් අවංක හදමනසක් තුලින් කරන අව්‍යාජ වන්දනාමානයන් ලෙස හෝ සත්‍ය දෙවිඳුට පිරිසිදු චේතනාවෙන් කළ වන්දනාමානයක් ලෙස හෝ නොවන්නේය.

එහෙයින් ව්‍යාජ දෙවිඳු කෙරෙන් ඉවත්වී අව්‍යාජ සත්‍ය පරම පිවිතුරු අල්ලාහ් දෙවිඳුට කීකරුවී වන්දනාමාන යන්

මහුට පමණක් කරන කළ එය ඉතසිතින් සදා බැතියෙන් නිහතමානීව කළ යුතුය. මන්දයත් එසේ කෙනෙකු මුළු හදින් ප්‍රේම කිරීමට කෙනෙකු වේ නම් එය අල්ලාහ් දෙවිඳු හැර අන් කෙනෙකු නොවිය යුතුය. මන්දයත් අල්ලාහ් දෙවිඳු කෙරෙහි ඇති විය හැකි ප්‍රේමය භුදෙක් ලෞකික කෙනෙකු කෙරෙහි උපදින, ඇතිවන ප්‍රේමය හා කිසිවිටෙක සමාන කළ නොහැකිය. අල්ලාහ් දෙවිඳු කිසිවක් නැතිව ශූන්‍යයක් ලෙස සිට මිනිසා නිර්මාණය කරන්නේය. ඒ අල්ලාහ් දෙවිඳුගේ නිර්මාණයේ අතිමහත් සූක්ෂම තත්ත්වයකි. එසේම විශ්වය තුල විද්‍යාමානව ඇති සියලු දේ නිර්මාණය කළේද මහුය. එසේම තම නිර්මාණය වන මිනිසාට සියලු වරප්‍රසාදයන්ද මහු සතු කර දී රූබර අන්දමින් සැකසුරුවමෙන් සකසා නිර්මාණය කළේය. පසුව මිනිසා සම්භාවණයට පත් කරනු වස් තමා විසින්ම මහුට ජීවය ලබා දී ස්වර්ගයේ සුරදූතයන් ලබා ශාෂ්ඨාංග කිරීමටද කටුයුතු කළේය. එසේ සම්භාවණයට පත්කළ අල්ලාහ්ගේ මැවීම්වලින් අති උසස් මැවීමක් ලෙස මිනිසා පත් කළේය. මහුට අනුභව පිණිස හොඳ පිරිසිදු ආහාරද දී තවත් සමහර දේද මහුට වසඟ කර දී, අල්ලාහ් දෙවිඳුගේ වදන වන අල්කුර්ආනයද උගන්වා මිහිපිට වාසය කරන සම්භා වණීය අල්ලාහ්ගේ නියෝජිතයා ලෙස පත්කළේය.

මිනිසා මෙසේ අති සම්භාවණීය තත්ත්වයක පසු වෙද්දී මහු ප්‍රේම කිරීමට අල්ලාහ් හැර අන් උසස් කෙනෙක් හෝ සුදුසු කෙනෙක් හෝ වේද? මහු අල්ලාහ් දෙවිඳු කෙරෙහි ප්‍රේම නොවන්නට ප්‍රේම කිරීමට අන් සුදුසු කෙනෙකු වේද? අල්ලාහ් දෙවිඳුගේ අතිමහත් අනුග්‍රහය ලෙස මිනිසා අති උසස් අන්දමින් නිර්මාණය කර රූපිත අන්දමින් සකසුරුවම් කර ලබා දුන් වරප්‍රසාධ සහ දැමිටුකම් නිසා අප අල්ලාහ් දෙවිඳු කෙරෙහි අති උසස් අන්දමින් ප්‍රේම කිරීමට බැඳී සිටිමු. ඉත

සිතින් අවංකව අල්ලාහ් දෙවිඳු සිහි නොකරන්නට කිසිසේත් අල්ලාහ් කෙරෙහි යථාර්ථව ප්‍රේම කළ කෙනෙකු වීමට නොහැකිය. එහෙයින් තමාට වෙනුවෙන් හොඳ සහ යහපත් කිරීමට ප්‍රිය වන්නේ කවරෙක්ද, ඔහුට යහකම් කරන කෙනා ලබා දුන්නේ, පත් කළේ අල්ලාහ් දෙවිඳු බවද වටහා ගත යුතුය. ලස්සන ප්‍රිය වන්නේ කවරෙක්ද නෙත්සිත් පිනවන අයුරු ඒ ලස්සන ලබා දුන්නේද ඒ අල්ලාහ් දෙවිඳු බව වටහා ගත යුතුය. තවද සියලු දැහී පරිපූරණත්වය කැමැති වන්නේ කවරෙක්ද අල්ලාහ්ගේ පරිපූරණත්වය හැර අන් පරිපූරණත්වයක් නැත යන බව හෙතෙම පැහැදිලි කර ගත යුතුය. එසේම තමා කෙරෙහි ප්‍රිය වන්නේ කවරෙක්ද තමා කෙරෙහි ප්‍රිය කරන අන්දමින් ඒ භවතා නිර්මාණය කළේද අල්ලාහ් දෙවිඳු බව මනාව වටහා ගත යුතුය.

අල්ලාහ් දෙවිඳුගේ බලමහිමය උන්නතිය ගැන පරමාධිපත්‍ය ගුණය ගැන මනා අන්දමින් දැණුමක් සාක්ෂාත් කර ගන්නේ කවරෙක්ද ඒ අර්ථානුසාරයෙන්ම සථිරසාරව අල්ලාහ්ට ප්‍රේම කරන්නේ ඔහුය. එසේම යමෙකු අල්ලාහ් දෙවිඳු ගැන දැණුමක් ලබාගෙන ඇත්තේ කොපමණද, අල්ලාහ් කෙරෙහි වූ ඔහුගේ ප්‍රේමයද ඒ ප්‍රමාණය හා සමාන වන්නේය. මුහම්මද් නබි (සල්) තුමා අල්ලාහ් දෙවිඳු ගැන මනා අන්දමින් වටහා ගෙන තේරුම් ගෙන අල්ලාහ් දෙවිඳුට කළයුතු බුහුමන් සහ වන්දමාන ඒ අන්දමින්ම කරගෙන සිටි හෙයින් එතුමා තම ජීවිතය කාලය තුලම අල්ලාහ් දෙවිඳුට අති ඉහළ අන්දමින් ප්‍රේම කරන අයෙකු ලෙස වූහ. දෛනික වන්දනාමානය එතුමාගේ නෙත්සිත් පින වන්නක් ලෙස විය. මන්දයත් දෛනික දේව නැමදුම මිනිස් සිතට සහ අල්ලාහ් දෙවිඳු අතර නොගිලිහෙන සම්බන් ධයක් ඇති කරන්නක් බව සුපැහැදිලිය. තවද වක්තෘ මුහම්මද් තුමා

තම එකම හිමි අල්ලාහ් දෙවිඳු ගැන මනා ලෙස වටහා ගෙන සිටි එකම හේතුව නිසා එතුමා අල්ලාහ් වෙතින් ප්‍රාර්ථනා සහ අයැදීම් කරනවිට, එතුමා අල්ලාහ් දෙවිඳු සම්මුඛ වීමට ඉතා සතුටෙන් පසුවන බවත්, ඔහුගේ මුහුණ දැක ප්‍රීතියට පත්වීම සඳහා අල්ලාහ් දෙවිඳු අභියසට පත්වීමට තමා කැමැතිදැයි එතුමාගෙන් විමසූ කළ එතුමා තම නිර්මාතෘ වරයා වන අල්ලාහ් දෙවිඳු වෙත ලඟාවීම ඉතා සතුටෙන් තෝරාගෙන ඇති බව පවසා ඇත.

එහෙයින් වන්දනාමානයන් සියල්ල අති උසස් අන්ද මින් අනුමතවී එයට නියම වූ ඵලවිපාක පරිසමාප්ත අන්දමින් සාක්ෂාත් කර ගන්නට නම් අල්ලාහ් දෙවිඳු ගැන මනා දැණුමක් තමා සතු කර ගතයුතු වන අතර, කරන සියලු යහකම් අල්ලාහ් දෙවිඳුගේ ආඥාව සහ මුහම්මද් තුමාගේ අනුශාසනාවන් සාරාංශ කොටගෙන කළ යුතුව ඇත. අල්ලාහ් දෙවිඳු ප්‍රියමනාපය ලබාගත් ඔහුගේ තෘප්තිය ලබා ගත් ආගමික දැහැන තුලට මුළුමනින්ම ඇතුල්වූ ඔහුගේ කීකරු අතවැසියන්ගේ ගණයට අප සියලු දෙනා අයත් වේවා යැයි ඒ අති දයාන්විත අල්ලාහ් දෙවිඳුගෙන් යටහත්පහත්ව ඉල්ලා සිටිමි.

සියල්ල දන්නේ අල්ලාහ් පමණි.

وصلى الله تعالى وسلم على نبينا محمد واله وصحبه وسلم

مطابع الحميضي ت 4581000 ف 4592217 الرياض

# مهمة

# الإنسان في هذا الوجود

## باللغة السنهالية

إعداد

القسم العلمي في الدار

الترجمة

عبد الحكيم محي الدين

المراجعة

محمد ناصم



Designed By : BANAN 012673455

# مهمة
## الإنسان في هذا الوجود

تأليف :

القسم العلمي بالدار

ترجمة :

عبدالحكيم محي الدين

دار الورقات العلمية للنشر والتوزيع

الرياض - الشفا - هاتف : ٤٢٠١١٧٧ - فاكس : ٤٢٢٨٨٣٧

ردمك ٠ ـ ٣ ـ ٩٥٤٩ ـ ٩٩٦٠